# යශෝරාවය

ත්‍රෛමාසික පුවත්පත

**විදුහලේ දැක්ම**

අභියෝග හමුවේ
නොසැලෙන
ගුණ නැණින් සුපෝෂිත
අභිමානවත්
දිරිය දියණියන්

තෙවන කාණ්ඩය තෙවන කලාපය - 2019 ජනවාරි, පෙබරවාරි, මාර්තු

මිල රු. 25/=



දුරකථනය:- 033 2222746 ෆැක්ස්:- 033 2222746 ඊමේල්:- gmydbv@gampahait.sch.lk වෙබ් අඩවිය:- www.yasodaradevibalika.edu.lk


## සාමාන්‍ය පෙළින් විශිෂ්ට ජයක්

2018 අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් විශිෂ්ට ප්‍රතිඵල ලබා ගැනීමට අප විද්‍යාලයීය ශිෂ්‍යාවෝ මෙවරද සමත්කම් පෑහ. විශිෂ්ට සාමර්ථ්‍ය 9ක් ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 81ක් වන අතර විශිෂ්ට සාමර්ථ්‍ය 8ක් සහ 7ක් ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාවද 81ක් වේ. විද්‍යාලයීය සමස්ත ප්‍රතිඵලය සලකා බැලූ කල මෙවර සමත් ප්‍රතිශතය 98.2% ක් වීම හා විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය 50% කට ආසන්න වීම විද්‍යාලය ලද විශිෂ්ට ජයග්‍රහණයකි.

## ඔලිම්පියාඩ් රන් පදක්කම ඇතුළු ජයග්‍රහණ රැසක්



2018/06/23 වන දින පවත්වන ලද 8වන ශ්‍රී ලංකා කනිෂ්ඨ තාරකා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියෙන් අප විද්‍යාලයීය සිසුවියන් විශිෂ්ට ජයග්‍රහණ රැසක් ලබා ගත්හ. ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය හා කොළඹ විශ්ව විද්‍යාලය එකමුතුව සංවිධානය කරන ලද මෙම තරගයේ ජයග්‍රාහකයෝ 2018/11/17 වන දින කොළඹ විශ්ව විද්‍යාලයේ New Arts Theater හිදී පැවති ත්‍යාග ප්‍රදානෝත්සවයේදී ඇගයීමට පාත්‍ර වූහ.

එහිදී ඩබ්.ඩබ්.එල්. නාවෝද්‍යා දුටුතිස්ස රන් පදක්කම් ලාභිනියක ලෙසත් ආර්.ආර්.එන්.කේ. අනන්‍යා චන්ද්‍රරත්න,

02 පිටුවට

## වාර්ෂික ක්‍රීඩා උළෙල

යසෝදරා දේවි බාලිකා මහා විද්‍යාලයීය 2019 නිවාසාන්තර ක්‍රීඩා උළෙල 2019-02-08 දින නගර සභා ක්‍රීඩාංගනයේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ගණේමුල්ල කමාන්ඩෝ රෙජිමේන්තුවේ කර්නල් සමන් පෙරේරා මහතා සහභාගී වූ අතර අවට පාසල්වල ගරු විදුහල්පතිවරුන් ඇතුළු සම්භාවනීය ආරාධිත අමුත්තෝ රැසක්ද සහභාගී වූහ.





## ශ්‍රී ලංකා බාස්කට්බෝල් ශූරතාව යශෝදරාවට

ශ්‍රී ලංකා බාස්කට් බෝල් සංගමය සංවිධානය කරන සමස්ත ලංකා බාස්කට්බෝල් තරගාවලියේදී අවුරුදු 19 න් පහළ අප පාසල් කණ්ඩායම එහි ශූරතාව දිනා ගත්හ. ජයග්‍රාහි ශිෂ්‍යාවන්ටත් ක්‍රීඩා භාර ආචාරිනී ටජීවනී කාරියප්පෙරුම ගුරු මහත්මිය ඇතුළු බාස්කට්බෝල් ක්‍රීඩාව භාර සියලුම ගුරු මහත්මීන්ටත් විද්‍යාලයේ උණුසුම් සුබ පැතුම් පිරිනමමු.

## පොලිස් ශිෂ්‍යභට කණ්ඩායම පාසල් 26ක් පරදා 06 වන ස්ථානය දිනාගනී.

රන්ටැඹේ ශිෂ්‍යභට පුහුණු මධ්‍යස්ථානයේදී පැවති පොලිස් ශිෂ්‍යභට තරගාවලියේදී අප පාසල ප්‍රථම වරට නියෝජනය කළ කනිෂ්ඨ පොලිස් ශිෂ්‍යභට කණ්ඩායම පාසල් 26ක් අතරින් 6 වන ස්ථානය ලබා ගත්හ. පුහුණුවීම් සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන් උප පොලිස් පරීක්ෂක ඩබ්.කේ.පී. විද්‍යාරත්න මහතාටත් ශිෂ්‍යාවන්ට නිබඳ ශක්තියක් වූ සහකාර විදුහල්පති තරංග දුනුආරච්චි මහතාටත් ඒකකය භාරව කටයුතු කළ ජානකී විජේසිංහ සහ ප්‍රදර්ශනී සේනානායක යන ගුරු මහත්මීන්ටත් කඳවුරුගත වීමේදී නන් අයුරින් සහය දැක්වූ සියලුම ගුරු මහත්මීන්ටත් විද්‍යාලයීය අභ්‍යාසලාභී ගුරු මෙනෙවියන්ටත් ජයග්‍රහණය වෙනුවෙන් පැසසුම් පුද කරමු.



ඔබ තුළ සිටින දුබලයාට සවන් නොදී ඔබේ ශක්තියම අරමුණු කරගන්න. (ලයිලා අකිටා)

ශ්‍රී ලංකාද්වීපය ලෝකයේ විශිෂ්ටතම රාජ්‍ය වන්නේ
අප එහි ගුණගරුක, කුසලතා පිරිපුන්
පුරවැසියන් වූ විට පමණි. **විදුහල්පතිනියගෙන්...**

# කතුවැකිය

ඔබට හදවතක් තිබේද යන ප්‍රශ්නය යමෙකු ඇසුවහොත් ඔබ දෙන පිළිතුර කුමක්ද? ඔබේ මුවට මද සිනහවක් නැගෙනු ඇත. මන්ද හදවතක් නොමැති කිසිම ජීවියෙකු මේ මිහිතලය මත ජීවත් නොවන බව ඔබ නියත වශයෙන් දන්නා බැවිනි.

ඔබට සජීවී හදවතක් තිබේද ? ඔව්. සත්‍ය වශයෙන්ම ඔබට සජීවී හදවතක් තිබේ. ඔබ ඔබේ අත ළය මත තබා එය සැබවින්ම සජීවී හදවතක් බව ප්‍රත්‍යක්ෂ කරගනු ඇත.

ඔබට ලස්සන හදවතක් තිබේද? මෙම පැනයට නම් ඔබට එකවරම පිළිතුරු දීමට නොහැකි වනු ඇත. ලස්සන හදවතක් සතු ලක්ෂණ හඳුනාගැනීම තුළින් ඔබත් මේ මිහිතලය සරසන සුවඳවත් කුසුමක් බවට පත්වේවි.

උම්මග්ග ජාතකයේ තලතා දේවින්ගේ ප්‍රතිඥාව ප්‍රකට කරවන එක් අවස්ථාවක් හුවා දැක්වුවහොත්, එහි සහල් නැලියක් බත්මුලක් හා මසු දහසක් ඇති පුරුෂයෙකු ඔහු ගඟෙන් එතෙර කරන පුරුෂයාට පවසනුයේ ''මේ වස්තූන් අතරින් යමක් මට රුචි වී නම් එය ඔබට දෙමි'' යන්නයි. ගඟෙන් එතෙර වූ ඉහත පුරුෂයා තම අත ඇති සහල් නැලිය හෝ බත්මුල ගන්නා ලෙස අනෙක් පුරුෂයාට පවසයි. හෙතෙම එය ප්‍රතික්ෂේප කිරීමේදී ඇතිවන ගැටලු සහගත තත්වය විසඳනු ලබන්නේ තලතා දේවිය විසිනි. සිය ප්‍රඥාව මෙහෙයවීමෙනි.

මදක් සිතා බලන්න, ඔබ අන්‍යයන් වෙත නිරන්තරයෙන්ම තිළිණ කරන්නේ ඔබට රුචි දේද? නැතහොත් අරුචි දේද? ඔබට රුචි දේ යනු ඔබ ප්‍රිය කරන දෙයයි. ආදරය, කරුණාව ලැබීමට ඔබ ප්‍රිය නම් ඔබද පෙරළා ලෝකයට ආදරය කරුණාව තිළිණ කළ යුතුය. ඔබ ඔබේ අභිමානය රැක ගැනීමට කැමති නම් අන්‍යයන්ටද අභිමානවත්ව ජීවත්වීමට ඉඩ සලසන්න.

ඔබ පිරිසිදුව සිටීමට කැමතිද? ඔබ ඔබේ මිදුල, ගෙවත්ත, පන්තිකාමරය පිරිසිදු කර ගැනීම මහඟු සත් ක්‍රියාවකි. එහෙත ඔබ ඔබේ පන්තිකාමරයෙන් ඉවත ලන කුණු ඔබ බැහැර කරන්නේ අවිධිමත්ව නම් එය අන් අයගේ ප්‍රියතාවට හේතු නොවනු ඇත. ඇතැම්විට සුපිරි වාහනවලින් පැමිණ තමාගේ නිවසේ කුණු මහමඟ දමායන පුද්ගලයන් ඔබද දැක ඇතිවාට සැක නැත. ඒ ඔහු ප්‍රිය කරන දේද? ඔහු පිරිසිදුව සිටීමට රුචිකරයි. අන්‍යයන්ද පිරිසිදුව සිටීමට රුචි බව ඔහුට අමතකව යයි.

ඔබ ඔබ තුළින් ලෝකය දකින්න. කැඩපතකින් ඔබේ ප්‍රතිබිම්බය බලා මුහුණේ හෝ වරලසෙහි අඩුපාඩු සකස් කරගන්නා සේ ම ඔබේ චරිතයෙහි ඇති අඩුපාඩුකම් සකස් කරගන්න. නොසරුප් වචන, ආකාරුණික හැසිරීම් රටා, අසත් ක්‍රියාකාරකම් සමාජය අසුන්දර කරන බව නිරතුරුවම සිතට ගන්න.

ඔබේ හදවත මල් උයනක් නම් එහි තිබිය යුත්තේ සුගන්ධවත් පුෂ්පයන් පමණකි. කුරිරු ගොර සතුන්ට කිසිවිටෙකත් ඒ සුන්දර මල් උයන ආක්‍රමණය කිරීමට ඉඩ නොදෙන්න.

ඔබේ පිවිතුරු සිනහව ලොව සනහන අමාවක් වේ නම් ඔබේ කාරුණික වචන සිත් නිවන ගීතයක් වේ නම් ඔබේ හැසිරීම ලොවෙහි ඉදිරිගමනට අත්වැලක් වේ නම් සැබවින්ම ඔබ සතුව ඇත්තේ ලස්සන හදවතකි. එවන් ලස්සන හදවතක් ඇති ඔබ සැබවින්ම ලොව සරසන සුගන්ධවත් පියුමක්මයි.

## අ.පො.ස. සමාන්‍ය පෙළ A9 ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 2014 - 2018




**පළමු පිටුවෙන්**

## ඔලිම්පියාඩ් රන් පදක්කම....

**ඩබ්.පී.එන්.එන්.එස්. උපුලි වර්ණසූරිය හා කේ.එම්.ආර්. තිසත්මා ලෝකඩ පදක්කම්ලාභීන් ලෙසත් එම්.කේ.ජී.ඩී. තරුෂා තිසරණි ප්‍රේමචන්ද්‍ර හා කේ.ජී.එන්. සසිනි බණ්ඩාර විශිෂ්ට සම්මානලාභීන් ලෙසත් පදක්කම් සහ සහතිකපත් දිනාගනිමින් විද්‍යාලයට කීර්තියක් අත්පත් කර දුන්හ. ශිෂ්‍යාවන් ජයග්‍රහණය සඳහා මෙහෙයවූ සහකාර විදුහල්පති තරංග දුනුආරච්චි ගුරු පියාණන් ඇතුළු ජයග්‍රාහී ශිෂ්‍යාවන් හට විද්‍යාලයේ උණුසුම් සුබ පැතුම් පිරිනමමු.**

## සංස්කාරක මණ්ඩලය

**ප්‍රධාන උපදේශක** - එච්.එම්. ගයානි වත්සලා මිය (විදුහල්පතිනිය)

**සංස්කාරක මණ්ඩලය** -
1. මාධවී රූපසිංහ මිය (සහකාර විදුහල්පතිනිය)
2. සුමුදු හේරත් මිය
3. විචිත්‍රා මාපිටිගම මිය
4. චින්තා කුමාරිහාමි මිය
5. කේ.ඒ. රසිකා සිරිවර්ධන මිය

**සිසු කමිටුව** -
1. නිමාෂි සංදීපා
2. ඊ.ඒ. හංසනී පියුමිකා
3. කේ.කේ. සියුමි සෙව්මිණී කීරවැල්ල
4. නෆීෂා අෆ්ෂාරා අහමට්
5. හිරුෂි අමාෂා
6. ලක්ෂාණි නෙත්මි
7. පබසරා සෙව්වන්දි
8. අයෝධ්‍යා යොමාලි
9. හිරුණි පූර්ණිකා
10. තරුෂි පූර්ණිමා
11. ශනාලි තත්සරණි

**ඔබ, ඔබ දෙස බලන්නේ අවතක්සේරුවෙන් නම් සාර්ථකත්වය සිහිනයකි. (ස්ටීව් මාබෝලි)**

# සදහම් පණිවිඩය

## ආදරණීය දුවේ,

මේ ලිපිය කියවන ඔබේ දෙනෙත් දැන් වේගයෙන් මෙ අකුරු මත ගමන් කරනවා නේද? මට එහෙම හිතෙනවා. ඒත් දුවේ ඔබේ දෙනෙත් දකින දේ එතරම් වේගයෙන් ඔබේ මනසට ඇතුළු වෙනවද?.

මේ ලිපිය මම ලියන්නේ ඔබේ දෙනෙතට විතරක් නෙමෙයි ඔබේ මනසට, ඔබේ හදවතට. ඒ නිසා දුවේ මේ ලිපිය ඔබේ දෙනෙතින් වගේම හදවතිනුත් දකින්න ඕනෙ.

රත්තරං දුවේ ඔබ හැදෙන්නෙ වැඩෙන්නෙ යසෝදරා අම්මගෙ උකුලෙ. ඔබ පෝෂණය වෙන්නෙ යසෝදරා අම්මගෙ සිප්කිරිවලින් ඔබ දන්නවද ඒ කිරිවල තියෙන්නෙ නැණ විතරක් නෙමෙයි, කරුණාව, දයාව, මෛත්‍රිය, අවිහිංසක බව, සත්‍යවාදි බව වගේ ගොඩක් පෝෂක ඒ හා මුසුව තියෙනවා.

දුවේ එවැනි ගුණාංග අපේ ජීවිතය සරසන බව බුදුන්වහන්සේ පවා පෙන්වා දී තිබෙනවා. තුන් සූත්‍රයට අයත් කරණීයමෙත්ත සූත්‍රයේ මුල් කොටසෙ මෙත්වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග සඳහන් වෙනවා. ඒ වගේම මෙත් වැඩීමෙන් අපට ලැබෙන ආනිශංස බුදු දහමේ සඳහන් වෙනවා.

යමෙක් පංචශීලය ආරක්ෂා කළ යුත්තේ තමාට වගේම අන් අයට සිදුවන සමාජයීය යහපත ගැන සිතා බව බුදු දහම පෙන්වලා දෙනවා. ඒ අනුව වැලකීම හෙවත් විරතියත් හැසිරීම හෙවත් සමාදානයත් අනුගමනය කරනව නම් ඒ පුද්ගලයාගේ මෙන්ම සමාජයේම යහපත සැලසෙනවා.

ඒ වගේම තමයි දුවේ, සිඟාලෝවාද සූත්‍රයට අනුව කෙනෙක් තමන්ගේ යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටුකරනව නම් අපේ ජීවිත සාර්ථක කරගන්න පුළුවන්.

අනෙක් වැදගත්ම කරුණ තමයි දුවේ, අපේ ජීවිතය සාර්ථක කරන ඉවසීමේ ගුණය ප්‍රගුණ කිරීම පුද්ගලයෙකුගේ ජීවිතය සාර්ථකත්වය කරා ගමන් කරවීමට ඉතා වැදගත් බව බුදු දහම අපට කියා දෙනවා. අප බෝසතාණන් වහන්සේ ඉවසීමේ ගුණය ප්‍රගුණ කළ ආකාරය ශාන්තිවාදී ජාතකයේ පැහැදිලි කර දෙනවා.

ආගන්තුක සත්කාරය දිවිය සරසන තවත් වැදගත් ගුණාංගයක්. කාන්තාවක ලෙස හෙට ලෝකය දිනන්න මේ ගුණය ප්‍රගුණ කළ යුතුමයි. බුදුන් වහන්සේ මෙම ගුණාංගයේ තියෙන වටිනාකම පත්තකම්ම සූත්‍රයෙන් පෙන්වාදී තිබෙනවා.

ඉතිං දුවේ, යසෝදරා මාතාව ඇයගේ උකුළ හැකි සෑම වෙලාවකම සඳහම් වැඩසටහන්වලින් පුරවාගන්නෙ ඔයාලට මේ ගුණ ලබාදෙන්න. බුදු දහමට අනුව ජීවිතය සරසගන්න ඔයාලට පාර පෙන්වන්න.

යසෝදරා මාතාව හීන දකින්නෙ නැණෙන් විතරක් පරිපූර්ණ දියණියක දැයට දායාද කරන්න නෙමෙයි. නැණ, ගුණ දෙකෙන්ම සුපෝෂණය වුණු දුවෙකු දැයට දායාද කරන්න.

ඉතිං දුවේ, නැණෙන් ලොව ජයගන්න හැම දෙනාටම එක වගේ බැරිවුණත් යසෝදරා අම්මගෙ හැම දුවෙකුටම ගුණෙන් ලෝකය ජයගන්න පුළුවන්.

ඔබ යසෝදරා අම්ම දකින හීන සැබෑ කරන දියණියක් වන්න අධිෂ්ඨාන කරගන්න.

**මේ ඔයාලගෙ ආදරණීය ගුරුතුමිය නාලිකා ජයමහ.**

# ජය දද නැංවූ යසෝදරාව

## සමස්ත ලංකා බැට්මින්ටන් තරගාවලිය

2018 නොවැම්බර් 31 සහ දෙසැම්බර් 1, 2, දිනයන්හිදී කුරුණෑගල බෝයගනේ හමුදා කඳවුරු ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවති සමස්තලංකා බැඩ්මින්ටන් තරගාවලියේ බී-කාණ්ඩයේ සමස්තලංකා අනුශූරතාව දිනාගැනීමට අප විද්‍යාලයේ වයස අවුරුදු 11 න් පහළ බැඩ්මින්ටන් කණ්ඩායම සමත් විය. ක්‍රීඩාව භාරව කටයුතු කරන පිල්කා ගුණසේකර මහත්මිය සිසුවියන් ජයග්‍රහණය කරා මෙහෙයවූවාය. ජයග්‍රාහී කණ්ඩායම හා ඒ සඳහා දිරි දුන් ගුරු භවතුන් වෙත විද්‍යාලයීය සුභාශිංසන පිරි නමමු.

## ගෘහආර්ථික විද්‍යා දැනුම මිනුම තරගාවලිය

2018 අ.පො.ස. (සා/පෙළ) ගෘහ ආර්ථික විද්‍යා දැනුම මිනුම තරගාවලියෙන් අප විද්‍යාලයේ 2018 වර්ෂයේ 11- බී ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ ප්‍රමුදි පියුමිකා නිශාමනී සමරවික්‍රම සමස්තලංකා 8 වන ස්ථානය ලබා විද්‍යාලයට කීර්තියක් අත්කර දුන්නාය.

## ශ්‍රී ලංකා පාසල් බාස්කට්බෝල් තරගාවලිය

ශ්‍රී ලංකා පාසල් බාස්කට්බෝල් සංගමය මගින් මෙහෙයවූ අවු 15න් පහළ කලාප මට්ටමේ තරගාවලියේදී තෙවන ස්ථානය දිනා ගැනීමට අප විද්‍යාලයීය කණ්ඩායම සමත් විය.

## YGROW කඳවුර

2018.12.07 වන දින සිට 2018.12.10 වන දින දක්වා සිව් දිනක් පුරා පැවති මාදම්පේ YGROW කඳවුරේදී කුඩා මිතුරියක ලෙස ලබා ගත හැකි ඉහළම අභියෝගය සඳහා රංචු නිවාඩුව, රෙවල්ස් සහ ස්ලීප් ඕව(ර්) යන අංශ තුන සඳහාම සාර්ථකව මුහුණ දුන් අප කුඩා මිතුරියෝ සහතික පත්‍ර දිනා ගත්හ. එහිදී අප විද්‍යාලයේ බාලදක්ෂ නායිකා චම්පා රණබාහු ගුරු මහත්මිය බලපත්‍රධාරිනිය ලෙස කඳවුරට සහභාගී වූවාය.

## අධ්‍යාපන අමාත්‍යංශය මෙහෙයවූ විවාද තරගය

අධ්‍යාපන අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් පවත්වන ලද විවාද තරගයෙන්දී ගම්පහ සිරිකුරුස විද්‍යාලය අබිබවා ලකුණු 981 ට ලකුණු 1062ක් ලබා ගනිමින් අප විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ විවාද කණ්ඩායම විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත්හ. රශ්මි නිමාෂා විජේසිංහ ශිෂ්‍යාවගේ නායකත්වය යටතේ හංසිකා රත්නායන, කාවින්දි කේෂානි සහ අශිනි හිරුෂිකා මේ සඳහා සහභාගී වූ අතර ප්‍රියමාලි ජයවර්ධන ගුරු මහත්මිය ඔවුන් ජයග්‍රහණය කරා මෙහෙයවූවාය.

## අන්තර් පාඨශාලීය විවාද තරගාවලිය

ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයීය ශිෂ්‍ය නායක සංසදය මඟින් සංවිධානය කරන ලද අන්තර් පාඨශාලීය ශිෂ්‍ය නායක විවාද තරගාවලියේදී 2019-02-05 වන දින පැවති තරගයේදී අප විද්‍යාලයීය ශිෂ්‍ය නායිකා විවාද කණ්ඩායම අර්ධ අවසාන වටයට තේරී පත්වූහ. ප්‍රියමාලි ජයවර්ධන ගුරු මහත්මිය ශිෂ්‍යාවන් පුහුණු කිරීමෙන් ඔවුන් ජයග්‍රහණය කරා යොමු කරවූවාය.

## නර්තන හා මුද්‍රානාට්‍ය තරගාවලියේ කලාප මට්ටමේ ජයග්‍රහණ

පසුගිය මාර්තු දෙවන දින පැවති සමස්තලංකා නර්තන හා මුද්‍රානාට්‍ය තරගාවලියේ කලාප මට්ටමේ තරගවලදී අප විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නර්තන කණ්ඩායම් ප්‍රථම ස්ථාන ලබා පළාත් තරග සඳහා සුදුසුකම් ලැබූහ. ඉදිරි ජයග්‍රහණ සඳහා විද්‍යාලය වෙනුවෙන් උණුසුම් සුබපැතුම් පිරිනමන අතර නර්තන විෂය භාර උත්පලා එදිරිසිංහ, සුජීවා හෙට්ටිආරච්චි හා ඉසංකා වෙඩිවර්ධන යන ගුරු මහත්මීන්ද ගෞරවයෙන් සිහිපත් කරමු.

## ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කළ පිහිනුම් තරගාවලිය

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් දෙවන වරටත් සංවිධානය කරන ලද රිට්ස්බරි ආයතනයේ අනුග්‍රහයෙන් පැවති දිවයිනේ බොහෝ පාසල් සංඛ්‍යාවක් සහභාගී වූ පිහිනුම් තරගාවලියෙන් පාසල් 400ක් අභිභවමින් වයස අවුරුදු 10න් පහළ බාලිකා අංශයේ ශූරතාව දිනාගැනීමට අප විද්‍යාලයේ 5 ශ්‍රේණියේ සෙනුදි නෙහන්සා ශිෂ්‍යාව සමත් වූවාය. එසේම එම තරගාවලියේදී වයස අවුරුදු 18න් පහළ සහාය පිහිනුම් අංශයෙන් තුන්වන ස්ථානය දිනාගැනීමට අප විද්‍යාලයීය කණ්ඩායම සමත් වූහ. පිහිනුම් ක්‍රීඩා භාර සුජීවා චාන්දනී කළුආරච්චි ගුරුමහත්මිය ශිෂ්‍යාවන් ජයග්‍රහණය සඳහා මෙහෙයවූවාය.

## නව නිපැයුම් තරගාවලියෙන් රිදී පදක්කමක්

"Aurora-2018" නව නිපැයුම් තරගාවලියේදී ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශයේ රිදී පදක්කම 10 ශ්‍රේණියේ ඩබ්.ඩබ්.එල්.එන්. දුටුතිස්ස ශිෂ්‍යාව විසින් දිනා ගන්නා ලදි. තරගාවලිය සඳහා නව නිපැයුම් 20ක් අප විද්‍යාලයීය ශිෂ්‍යාවන් විසින් ඉදිරිපත් කරන ලද අතර එහිදී වැඩිම නව නිපැයුම් සංඛ්‍යාවක් ඉදිරිපත් කළ පාසල ලෙස ද අප විද්‍යාලය විශේෂ ඇගයීමකට පාත්‍ර විය. ශිෂ්‍යාවන් ජයග්‍රහණය සඳහා මෙහෙයවනු ලැබුවේ විද්‍යාලයේ සහකාර විදුහල්පති තරංග දුනු ආරච්චි මහතා විසිනි.

කෙටි කථාව



# ඉරණමක කථාවක්

වායු සමීකරණය මගේ මුහුණට මුහුණ පිහිටියත් මේ මොහොතේ මට එයින් දැනෙන්නේ හුස්ම හිරකරවන තරමේ අපහසුවකි. හදවතේ නොඉවසිලිමත් බව කොතෙක් වුවත් හිතේ මහ බරක් ලැගුම්ගෙන ඇතිවාක් මෙන් දැනේ. යාන්ත්‍රිකව මෙන් හැසිරෙන ගැහැනු පිරිමි කොරිඩෝවේ ඇවිද යන්නේ අවිඥානික වහලුන් සේය. නමුත් මට මෙසේ ද සිතේ. වසරක් පුරාම දිගින් දිගටම ප්‍රතික්ක්ෂප්ප වීම නිසා රැකියා නියුක්තිය පිළිබඳ මාගේ දෘෂ්ටිය වෙනස් වී ඇති සේය. මා හටත් රැකියාවක් ලැබුණු දිනෙක නැවතත් මාගේ ප්‍රකෘති දෘෂ්ටිය මට ලැබෙනු ඇත.

මෙය මාගේ හයවන සම්මුඛ පරීක්ෂණයයි. මෙතුවක් මා ප්‍රතික්ෂේප වූයේ මා සුදුසුකම් සපුරා නැති නිසා නොවේ. අන් අය ඒවා වැඩිමනක් සපුරා ඇති නිසාය. නමුත් මෙවර නම් මා සිත තුළ කුඩා තරු එළියක් වැනි අපේක්ෂාවක් ඇත. මන්ද යත් අද දින ඔවුන් මා කැඳවූයේ දෙවෙනි වතාවට වීම නිසාය.

''අද අපි ප්‍රායෝගික පරීක්ෂණයක් තමයි කරන්නේ. මොකද ඔයාලා හැම දෙනාම අපිට අවශ්‍ය සුදුසුකම් ඒ විදිහටම සම්පූර්ණ කරපු අය. මේ අවස්ථාව බොහොම විශේෂ එකක්. ඒ නිසා අපි තෝරා ගන්නෙත් එක විශේෂ කෙනෙක් විතරයි.''

කළමනාකරු එම අවස්ථාව කෙටියෙන් පැහැදිලි කර දුන්නේය.

''ඔයාලට පේනවද අතන තියෙන පෙට්ටි හතර? ඔයාලා ගිහින් ඔයාලා ළඟ තියෙන වටිනාම දේ ඒවාට දාලා එන්න.''

එය තරමක් වෙනස් නමුත් සරල දෙයකි.

ඒ පරීක්ෂණයට මුහුණ දී අපි සිව්දෙනෙක් කොරිඩොවේ අපේක්ෂා සහගතව සිටියෙමු. එතෙක් අපට ප්‍රතිඵල දැන්වූවේ නැත. මගේ අත් ඔරලෝසුවේ තත්පර කටුවේ හඬද මට පැහැදිලි ව ඇසේ. කොරිඩෝවේ දල්වා ඇති විසිතුරු විදුලි බුබුළුවල කහ පැහැ ආලෝකය දෑස් අඩවන් කරන සුළුය. මගේ සිත අතීතයට දිව යයි.

''අයියෝ... අයියේ, ඔයා ඔය මොකද්ද කරන්නේ? ඔයාට පාඩුවේ ඉන්න බැරිද? ඔහු තුනට හතරට නවමින් නැවත දිග හරිමින් සිටියේ මට මගේ ජීවිතේ මුල්ම වතාවට ලැබුණු සහතික පත්‍රයයි. එය ලැබීද ගත වූයේ පැය කිහිපයක් පමණි. නමුත් මේ වන විටත් එය සයිවර් කඩේ ලොසින්ජර් ඔතා දෙන කොළයකට සමාන වී තිබුණි.

ඔහුගේ නම ලක්මාල්ය. මටත් ලක්මාලි යැයි නම තබා ඇත්තේ ඒ නිසාය. අයියා මට වඩා වසර තුනකින් වැඩිමහලුය. නමුත් ඔහු අපට වඩා වෙනස්ය. උපතේ සිටම ඔහුගේ දුර්වලතාවක් ඇති බව දික්හේනේ වෙද මහතෙකු පැවසූ බව අම්මා නොයෙක්වර කියනවා මට ඇසී ඇත. ඔහු මට වඩා සුදුය. හැසිරෙන්නේ පොඩි දරුවෙකු ගානටය. ඔහුගේ සියලුම දේ අප විසින් කර දිය යුතුය. ඔහු දන්නේ මුහුණ ඇඹුල් කරගෙන බලා සිටීමට පමණි.

මම දහය පන්තියේය. ශිෂ්‍යත්වය සමත් වුවත් ටවුමේ පාසලකට යාමට තරම් මුදල් නොමැති නිසා මා දැනුදු යන්නේ ගමේ පාසලටය. නමුත් අයියා කිසිදින පාසල් ගොස් නැත. ඉස්සර මා සිතුවේ අයියාගේ අසනීපය නිසා අම්මලා ඔහු පාසල් නොයැවූ බවයි. නමුත් අයියාව පාසලට ඇතුළත් කිරීමට යාමේදී මන්දබුද්ධිකයෙකු යැයි බැණවැදී ඔවුන්ව විදුහල්පතිතුමා පන්නා දැමූ බව මා දැනගත්තේ මෑතකදීය. ඔහුට කිරීමට ඔහුගේ කියා වැඩක් නැති නිසා සෑමවිටම ඔහු මගේ වැඩවලට ඇඟිලි ගසයි. ඒවිට මා කේන්තියෙන් බැණවැදුණද ඔහු පවසන දේවල් මට තේරෙන්නේ නැත. නමුත් ඔහුට මා බැණ වදින බව වැටහේයැයි පසක්වන්නේ මුහුණ බිමට හරවා එතැනින් ඉවත්ව යන නිසාය.

එදිනද ඔහු මගේ වටිනා සහතිකයක් සමඟ සෙල්ලම් කළේය.

''අනේ අයියේ... ඔයාට ඇත්තටම වෙන වැඩක් නැද්ද..... දන්නවද ඕකට කියන්නේ සහතිකයක් කියලා.... ඔයාට තාත්තාගෙ හේනෙ වැඩවලටවත් උදව් කරන්න බෑ. මගේ වැඩවලට ඇයි ඇඟිලි ගහන්නේ?. පැත්තකට වෙලා ඉන්න බැරිද? ඔයාට ඉගෙනගන්නත් බෑ. වෙන වැඩ කරන්නත් බෑ. මේ අහන්න. ඔයා දැං ඔය පොඩි කරලා දාපු කොළේ තියෙනවා නේද? මං ලොකු වෙලා රස්සාවක් කරන්න යද්දී ඕක පෙන්නන්න ඕනෙ. නැත්නම් මට රස්සාවක් හම්බවෙන්නෙ නෑ. එතකොට මටත් ඔයා වගේ වැඩකට නැති කෙනෙක් වගේ තමයි ඉන්න වෙන්නෙ.''

''මං යනවා හේනට තාත්තට කෑම අරන්'' සහතිකය එතරම් වටිනා දෙයක් නොවේ. නමුත් එසේ නොකීවා නම් ඔහු එය මට දෙන්නේ ද නැත.

* * * * * * * * *

රෑ බෝවන විට ගමේ මිනිස්සු හුළු අතුත් පත්තු කරගෙන පාරවල් දිගේ කෑ ගසමින් දුවන්නට වූහ. ''අලි එනවෝ....හූ.....හූ...... දුවපල්ලා මගෙ අම්මලා..... දුවපල්ලා.....හූ....හූ....'' මුළු ගමම එකම ඝෝෂාවක් විය.

''අනේ අම්මේ..... අපිත් ඉක්මන් කරලා යමුකෝ....'' මිදුලට බැසගත් මම ද කෑගසන්නට වීමි. මඳ වේලාවකින් මමත්, අයියාත්, අම්මාත් සිටියේ පාරවල් දිගේ දුවන මිනිසුන්ට මැදිවය. තාත්තා හේනේ නිසා ගම්වැදුණු අලින්ගෙන් ඔහුට කරදරයක් නොවනු ඇත. අලින්ගේ හඬවල් ද ගම දෙසින් උස්ව ඇසේ. ඒ හඬවල් පරයා මිනිසුන්ගේ සෝ සුසුම් හඬ උස්ව ඇසේ.

''අම්මේ අ....අයියා කෝ..... වටපිට බැලුවත් ඔහු පෙනෙන්නට නැත. අප නිවසින් පැමිණද දැන් බොහෝ පැය ගණනක් ඉක්මගොස් ඇත. මගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. ඔහු සිටියේ අපත් සමඟමය. නමුත් දැන් ඔහු කොහේවත් නැත.

අම්මා හඬමින් අයියාව සොයන්නට වූවාය. මිනිසුන් ඔහුව දැක තිබුණත් කලබල මැද ඔවුන්ටද වැඩි නිනව්වක් නැත. දැන් එළිය වැටීමටත් කිට්ටුය. හදවතේ බිය ද කෙමෙන් කෙමෙන් වැඩි වේ. අලි කලබලය හිමිදිරිය වන විට තුරුල් වී යනු ඇත. නමුත් ඔහු කොහි නම් සිටීද? ඔහුත් අප නිවසට යන විට කොහි සිට හෝ පැමිණේවි ද?

මෙසේ සිතමින් අපි නිවස ඇති ඉසව්වට පියනඟන්නට වීමු. දැන් වටින් පිටින් එළිය වැටීගෙන එන බැවින් පෙනී යයි. අපි ඉදිරියට යද්දී මිනිසුන් පුදුමයෙන් මෙන් අප දෙස බලා සිටිනු පෙනිණ. හදවතට පළමු වතාවට බලාපොරොත්තු බිඳ වැටීමේ සේයාවක් ඇතුළු වූයේ එවිටය.

නිවසට ඇතුළු වන කඩුල්ල කැඩී තිබුණි. ගෙය ඇති ඉසව්වේ දැන් එවැන්නක් දැක ගැනීමට නොහැකිය. ගෙයම ගින්නකින් දැවී ඇත. එයින් පිටවන කළු පැහැ දුම උදෑසන හිරු එළිය වළකාලමින් හාත්පසම පැතිරී ඇත. නිවසේ බිත්ති කණු හතරින් දැනට ඉතිරිව ඇත්තේ දෙකක් පමණි.

මා සෑම තැනම බැලුවේ අයියා කොහි සිට හෝ ඒ දෙස බලා සිටිනවාදැයි දැකීමටය. නමුත් ඔහු නැත. අම්මා තෝන්තු වී ගසකට වාරු වී සිටියාය. ඇය ජීවිතයේ නොදැරිය හැකි කම්කටොළුවලින් බැට කා ඇතත් තමන් සතුව තිබූ සේසතම එක රැයින් අහිමිව යාම ඇයට දරා ගැනීමට නොහැකි වන්නට ඇත. අලියා පොඩිපට්ටම් කර විනාශ කර දමා ඇත්තේ අපේ නිවස පමණක් නොවේ. වසර ගණනාවක දුක් මහන්සියේ ප්‍රතිඵලයි.

මිනිසුන් වට වී සිටින තැනකට මමත් කිට්ටු වීමි. උදෑසන පින්නේ සීතල ඇඟට සිසිලසක් නොව තියුණු සැතකින් එල්ලකරන පහරක් වැනි විය. කුමක් දැක ගන්නට ලැබේවිදැයි දැන නොසිටියත් කෑලි කෑලිවලට බිඳී ඇති සිතට එය මහාලොකු වේදනාවක් නොවනු ඇත.

සෙනග පීරා ගොස් මමත් ඒ දෙස බැලුවෙමි. වැටී ඇති කෙසඟ සිරුර ලෙයින් නැහැවී ඇත. අලියා ඔහුගේ හිසම පොඩිපට්ටම් කර ඇත. නමුත් ඔහු හැඳ සිටි සරම හා කමිසය දැක පුරුදු එකකි.

මගේ දණහිස් වාරු නැති වී කපාලූ ගසක් මෙන් මා බිම ඇද වැටිණි. වසර දහසයක බැඳීම එක රැයකින් අවසන් වී ඇත. මගේ දෑසට කඳුළු උනන්නේ ද නැත. කතා කළත් උගුරෙන් කර කර හඬක් මිස වචන පිටවන්නේ ද නැත.

සිරුරේ අවයවවල සියලු හැකියාවන් අතුරුදන්ව ඇති සේය. මම ඔහුගේ ඇඹරී ඇති මුහුණ පිරිමැද්දෙමි. පපුවට වේගයෙන් ගැසුවෙමි. දෑත් සෙලෙවුයෙමි. ඒවිට ඔහුගේ දෑතේ මිට මොලවාගෙන සිටි කොළ ගුලියක් බිමට වැටුණි. එය දිගහැර බැලූ විගස සිරුරෙන් පැනගොස් තිබූ ශක්තිය නැවත ලැබුණි. දූවිලි වැකුණු පොඩි වී ගිය සහතික පත්‍රය ඔහු අතේ සුරැකිව ඇත. එය රැක ගැනීමට ඔහු ඔහුගේ දිවිය පරදුවට තබා ඇත. රාත්‍රියේදී අපෙන් මිදී ඔහු නැවත යන්නට ඇත්තේ එය ආරක්ෂා කිරීමටයි. ඔහුට අනුව මගේ අනාගතය ආරක්ෂා කිරීමටයි.

ඉතිරිය 05 පිටුවට

ඊයේ දවසට අද දවස කෙරෙහි බලපෑමට ඉඩ නොදෙන්න. (විල් රොජර්ස්)



# මගෙ දුවේ නුඹ අවදියෙන්නම්,

## ආදරණීය දියණිවරුනි,



රත්තරන් දුවේ මගේ
රත්තරන් දුවේ
ඔබයි දිවිය
අර්ථවත් කළේ

දුව ඉපදුණා දා මට දැනුණේ එවන් වූ හැඟීමක්, පුංචි දූ නිල් ඇස් දෙකෙන් මොනවදෝ කියනවා වගේ ආදරණීය බවක් මට දැනුණා. මුලින්ම ඔයාව තුරුලු කරගත් මගේ දෑතට මේ මොහොතේත් ඒ උණුසුම දැනෙනවා වාගෙයි මට මතක් වෙන්නෙ. දුවගේ සුරතල් මොළකැටි අත් පා දිනෙන් දින වැඩී දුව පාසල් යන දිනය ළඟා වුයේ කාලයටත් නොදැනීමයි. අකුරු කරන්නට යසෝදරා දියණියක ලෙස වරම් ලබද්දී මට ඇති වූ අප්‍රමාණ සතුට වචනයෙන් ප්‍රකාශ කළ නොහැකි තරම් වුණා.

දුව පළමු ශ්‍රේණියේ සිට තනිවම පෞද්ගලික වෑන් රථයට නංවන්නේ මගේ හදවතෙහි සැඟවුණු වේදනාවෙන්. දුව තනිව පුංචි අත ඔසවා කියාපාන්නේ ඒ කිසිවක් නොදන්නා බවයි. එසේ ගිය ඔබ ශිෂ්‍යත්ව හා සාමාන්‍යපෙළ කඩඉමත් පැන ගොස් 12 ශ්‍රේණියට පා තබද්දී මට සිතුණේ මගෙ කෙල්ල දැන් ගොඩක් ලොකු වෙලා නේද කියලා.

මගේ රත්තරන් දුවේ, රුව, ගුණ, නැණ බෙලෙන් පොහොසත් වූ තරමටයි දුවගෙ වටිනාකම වැඩිවෙන්නෙ. එදා වගේම අදත් යසෝදරා දියණියන් ලොව ජය ගන්නට පෙළගැස්වීමයි. මෑණියගේ එකම පැතුම යශෝදරා මාතාව හැමදාමත් නාමල් සුවඳින් සුවඳවත් වෙනවා. නාමල් සුවඳ දිගෙයි දුවට පියාපත් ලැබිලා තියෙන්නෙ. ඒ පියාපත් හොඳට පිරිමැදලා හැඩවැඩ කරලා දෙන්නේ ආදරණීය යසෝදරා

මව්තුමියයි. ඒ මව්තුමිය දිවි හිමියෙන් රැකගෙන ලෝකය ජය ගන්නයි ඔබට බාරව තියෙන්නෙ. ඒ ජීවිතාවබෝධය හරිහැටි වටහා ගන්නට දූ පැටික්කියන්ටම හැකියාව ලැබේවා! යන්න මගේ පැතුමයි.

දුවේ, සොබාදහමින් පවා අප බලාපොරොත්තු වන යම් යම් දේවල් ලැබෙන්නේ කලාතුරකින්. අව්ව, වැස්ස පොළොවට ලැබෙන්නේ සොබාදහමට අවශ්‍ය විදියට මිස අපට අවශ්‍ය විදියට නෙවෙයි. දුව කරන හොඳ නරක හැමදාමත් කාටත් රහසින් යසෝදරා මව්තුමිය බලා ඉන්නවා.

නියගලා මලක ලස්සන දකිද්දී ඒ ලස්සනට යටින් හලාහල විෂ ඇති බවත්, දියණියේ නිතරම මතක තබා ගන්න. ඉතින් දියණිවරුනි, නිරන්තර අවධානයෙන් හා විමසිල්ලෙන් සිටීමෙන් ඔබේ ජීවිතය සාර්ථක කර ගන්නට මංපෙත් විවර වේවා.

දැන ඉගෙන ගත්තම
තමයි කෙනෙකුගෙ වත්කම
ගුණ නුවණ දැක්කම
දුවට සලකයි රටේ ඔක්කොම

**මීට ඔබේ ආදරණීය අප්පච්චී,**
**ජේ.සී. ප්‍රේමරත්න,**
**විශ්‍රාමික නාවික හමුදා නිලධාරි**

**04 පිටුවෙන්**

## කෙටි කථාව

**මා බොරුවට බැණ වැදුණු දේ ඔහු සත්‍ය ලෙස පිළිගෙන ඇත. මගේ ජීවිතයට ආලෝකයක් ගෙනදීමට ඒ කඩදාසියට හැකියයි ඔහු සිතන්නට ඇත. අවසාන මොහොතේ පවා ඔහු සිතා ඇත්තේ ඔහු ගැන නොව මා ගැනය. දැන් සියල්ල අවසානය. සිරුරෙන් පැනගිය සියලු ශක්තීන් මා එක්කර ගතිමි.**

**"අනේ මගේ අයියේ....."**

*** * * * * * * * ***

**"මිස් ලක්මාලි නේද?"**

**කල්පනා සාගරයෙන් මම අවදි වීමි. ගෙවී ගිය කාලය කල්පයක් මෙන් දැනුණත් ගතව තිබුණේ මිනිත්තු පහක් වැනි කෙටි කාලයකි. මටත් නොදැනීම දෙනෙතින් රූරා වැටුණු කඳුළු පිසදමා ගතිමි.**

**"ඔව්, මම තමයි."**

**"හරි අපි යමු මිස් ඇතුළට" සහයිකාවත් සමග නැවතත් මම පරීක්ෂණයට මුහුණ දුන් කුටිය වෙත පැමිණියෙමි.**

**ආයතන ප්‍රධානීන්ගේ මුහුණුවල පෙනුණේ සොම්නස් සිනහවකි. මගේ අපේක්ෂාවේ හිරු අහසටම මුදුන්වී ඇතුවාක් මෙන් දැනේ.**

**"එන්න ලක්මාලි. අපේ සුභපැතුම්. හොඳට වැඩ ටික කරගෙන යන්න." අතට අත දෙමින් ප්‍රධානියා පැවසුවේය.**

**නමුත් මා සෙවූ දෙය තිබුණේ කළමනාකාරවරයාගේ සුරතේය." මේක ඔයාට වටින්නේ ඇයි කියන්න නම් අපි දන්නෑ. ඒත් මේ අත් ඔරලෝසු, මොබයිල් ෆෝන්වලට වඩා මේක පිටිපස්සෙ ලොකු කතාවක් ඇති කියන්නනම් අපි දන්නවා. දුක් සහිත අතීතයකට හිමිකම් කියන, තැලී පොඩි වී දුර්වර්ණ වූ සහතික පත්‍රය නැවත මා වෙත ලබා දෙමින් හේ පැවසීය.**

**එය සත්‍යයකි. ඒ කතාව දන්නේ මා පමණකි.**

**දෛවය අප මෙහෙයවන්නේ නොසිතනා ඉමකටය. අදින් වසර නවයකට පෙරදී අයියා කළ කැපකිරීම, කැපකිරීමක්ම මිස යථාර්ථයක් වේ යැයි මා කෙදිනකවත් නොසිතුවෙමි. ඒ වසර නවයකට පෙර සිදුවූ සිදුවීමටත්, අද මේ මොහොතටත් මා පමණක් තනිවම සාක්ෂිකාරියක වී ඇත.**

**ඒ දුර්වර්ණ කඩදාසිය නැවතත් මගේ අනෙක් සහතිකපත්‍ර අතර ප්‍රවේශමෙන් රඳවාගෙන මම ළය සැහැල්ලු කර ගතිමි.**

**නිමි.**

**කේ. මදාරා දිව්‍යාංජලී**
12 - L (කලා අංශය)

අනාගතයට බිය නොවන්න. අතීතය උදෙසා නොවැලපෙන්න. (ෂෙලි)

# යසෝ පුවත්

## විශේෂ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන

අ.පො.ස. (උ/පෙළ) විභාගයට මුහුණ දුන් ශිෂ්‍යාවන් සඳහා විශේෂ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් පසුගියදා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. මේ අවස්ථාව සඳහා ගම්පහ කාර්මික විද්‍යාලයේ ගරු විදුහල්පති ආර්.පී.යූ. රාජපක්ෂ මහතා, වෘත්තීය මාර්ගෝපදේශිකා චම්මි බාලසූරිය මහත්මිය, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිපුණතා සංවර්ධන නිලධාරිනී අනූෂා දිසානායක මහත්මිය සහ ශ්‍රී ලංකා තරුණ සේවා සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජගත් ලියනගේ මහතා විශේෂ ආරාධිත දේශකයන් ලෙස සහභාගී වෙමින් සිසුවියන් දැනුවත් කළහ.

## පෙර පොහොය වැඩසටහන

2019 ජනවාරි මාසයට නියමිත පෙර පොහොය දින වැඩසටහන 2019.01.18 දින උදෑසන 7.30 සිට 8.30 දක්වා පාසල් පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී 6-13 ශ්‍රේණි ශිෂ්‍යාවන් සඳහා අනුරාධපුර බෞද්ධ හා පිලි විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය මිනුවන්ගොඩ ඥානවාස ස්වාමීන් වහන්සේ විසින් ධර්ම දේශනයක් පවත්වන ලදී.

## "මත්ද්‍රව්‍ය නිවාරණය දරුවන්ගෙන් උගනිමු."

මතින් නිදහස් රටක් බිහි කිරීමේ ජාතික අරමුණ පෙරදැරිකරගෙන මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ මෙහෙයවීම මත "මත්ද්‍රව්‍ය නිවාරණය දරුවන්ගෙන් ඉගෙන ගනිමු." යන තේමාව යටතේ පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ සතිය 2019.01.21 දින සිට 2019.01.25 දින දක්වා දිවයින පුරා ක්‍රියාත්මක වූ අතර ඊට අදාළ විවිධ වැඩසටහන් පාසල තුළද ක්‍රියාත්මක වූ අතර 2019.01.23 වන දින නීතිය ක්‍රියාත්මක කරන පරිස් සමග සිදු කරනු ලබන සාකච්ඡාව ගම්පහ පොලිස් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. එම අවස්ථාව සඳහා 9 ශ්‍රේණියේ ශිෂ්‍යාවෝ

## අල්ලස හෝ දූෂණයෙන් තොර සුපිළිපන්න සමාජයක්

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මගින් සංවිධානය කරන. ගම්පහ කාල අධ්‍යාපන කාර්යාලය මගින් මෙහෙයවන "අල්ලස හෝ දූෂණයෙන් තොර සුපිළිපන්න සමාජයක් පාසල තුළ ස්ථාපිත කිරීමේ බස්නාහිර පළාත් ආරම්භක වැඩසටහන ගම්පහ කලාපයේ විදුහල්පතිවරුන්ගේ සහභාගීත්වයෙන් 2019.01.25 වන දින පෙ.ව. 3.00 සිට පාසල් ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි. මේ සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස් චන්ද්‍රනාත් නෙවිල් ගුරුගේ මැතිතුමා ඇතුළු එම ආයතනයේ අධ්‍යක්ෂවරු ද සහභාගී වූහ.

## සත්සරණී - 2019

පෙරදිග සංගීත අංශය මගින් ඉදිරිපත් කරනු ලබන "සත්සරණී - 2019" ශාස්ත්‍රීය ගායනා සංගීත ප්‍රසංගය හා වැඩමුළුව 2019.02.02 දින පෙ.ව. 9.00 සිට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී ජානකී පතිරණ මහත්මිය හා සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ සංගීත අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී සන්ධ්‍යා ඉලේපෙරුම මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තන් වශයෙන් මෙම අවස්ථාවට සහභාගී වූ අතර "උ/පෙළ පෙරදිග සංගීත විෂය හදාරන සිසුන් සඳහා ශාස්ත්‍රීය ගායනා ශෛලීන් පිළිබඳ ව්‍යාපෘතිය" යටතේ මෙම ප්‍රසංගය පැවැත්විණ.

## ප්ලාස්ටික් නිෂ්පාදන එකරැස් කිරීමේ ඒකකය

මධ්‍යම පරිසර අධිකාරිය මගින් ප්ලාස්ටික් නිෂ්පාදන එකරැස් කිරීමේ ඒකකයක් පාසල වෙත ලබා දෙන ලදී. පරිසරය සුරැකීමේ පරමාර්ථයෙන් දියත් කරනු ලබන මෙම ව්‍යාපෘතිය සඳහා පාසල් ප්‍රජාවගේ නොමඳ දායකත්වය ලැබී ඇත.

## වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහන

ශිෂ්‍ය නායිකා සංසදය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ලේ දන්දීමේ වැඩසටහන මෙවරත් 2019.02.01 වන දින උදෑසන 8 සිට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වුණු අතර විද්‍යාලයීය හා බාහිර ප්‍රජාවගේ නොමඳ දායකත්වය ඒ සඳහා ලබා දෙනු ලැබිණ.

## කුමාරතුංග මුනිදාස ගුණානුස්මරණ දිනය

කුමාරතුංග මුනිදාස ශ්‍රීමතාණන්ගේ ගුණ අනුස්මරණ දින සැමරුම 2019.03.05 වැනි දින විද්‍යාලයීය පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී එතුමාණන් පිළිබඳ ගුණකථන කිහිපයක්ද, නාට්‍යයක් හා ගීතයක්ද ඉදිරිපත් කෙරුණු අතර වැඩසටහන විදුහල්පතිතුමිය ඇතුළු ගුරු සිසු සියලුදෙනාගේ පැසසුමට බඳුන් විය.

## බෞද්ධ සංගමයේ නිල ලාංඡන පැලඳවීම

බෞද්ධ සංගමයේ සාමාජිකාවන් හට නිල ලාංඡන පැලඳවීමේ උත්සවය 2019.03.12 වන දින විද්‍යාලයීය පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී ශිෂ්‍යාවෝ 75 දෙනෙක් විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයේ ගුරු මහත්ම මහත්මීන් අතින් නිල ලාංඡන පලඳවනු ලැබූහ.

## ප්‍රාථමික අංශයේ සිසු පොළ

ප්‍රාථමික අංශයේ සිසු පොළ 2019.03.15 වන දින බාස්කට් බෝල් ක්‍රීඩා පිටියේදී විචිත්‍රවත් අයුරින් පැවැත්විණ. විදුහල් ප්‍රජාව ඇතුළු දෙමාපියෝ මේ අවස්ථාවට සහභාගී වූහ.

## ජාතික නිදහස් දින වැඩසටහන

ජාතික නිදහස් දින වැඩසටහන 2019.02.05 වන දින විදුහල් බිමේදී පැවැත්විණ. එහිදී නිදහස් දිනය අර්ථවත් කරමින් සුමුදු සුදර්ශන ගුරු පියාණන් විසින් හරවත් කතාවක් ඉදිරිපත් කෙරිණ.

## මහාචාර්ය රංජිත් මහානාම මහතාගේ දේශනය

අ.පො.ස. උසස් පෙළ විද්‍යා සිසුන් සඳහා සංවිධානය කරන ලද මහාචාර්ය රංජිත් මහානාම මහතාගේ දේශනය 2019.03.08 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. විද්‍යා සංගමය විසින් සංවිධානය කරන ලද මෙම දේශනය විෂය මාලා නවීකරණය හා ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය ආදී කරුණු රැසකින් සමන්විත විය.

## ජාත්‍යන්තර කාන්තා දින සැමරුම

ජාත්‍යන්තර කාන්තා දින සැමරුම 2019.03.08 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. ගුරු මණ්ඩලයේ ගුරු පියවරුන් විසින් ගුරු මෑණිවරුන් වෙනුවෙන් පැවැත්වුණු මෙම සැමරුම සුවිශේෂ මතක සටහන් පිරුණක් විය.

## විද්‍යාලයීය තොරතුරු තාක්ෂණ දිනය

විද්‍යාලයීය තොරතුරු තාක්ෂණ දිනය 2019.03.01 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. "අන්තර්ජාලය තුළ පවතින අපරාධ හා ආරක්ෂාව" තේමා කරගත් තොරතුරු තාක්ෂණ දිනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රචලිත කිරීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළ කම්ටුවේ ප්‍රධාන කම්ටු සාමාජික මොරටුව විශ්ව විද්‍යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී විශාකා නානායක්කාර මැතිනියයි. අනුග්‍රාහක දායකත්වයක් ලබා දුන් E-soft ආයතනයේ ගරු කළමණාකාරතුමා ද විශේෂ ආරාධිත අමුත්තා ලෙස මෙම අවස්ථාවට සහභාගී විය. වෙනත් පාසල් 13 ක ශිෂ්‍ය ශිෂ්‍යාවෝද මේ සඳහා සහභාගී වූහ.

අලුත් අදහසක් වටහා ගැනීමට අවශ්‍ය නම්, පරණ පුරුද්දක් බිඳින්න. (ජිනී ට්‍රුමර්)

# සිංහරාජයේ වගතුග - 3

## සිංහරාජයේ වෙසෙන සතුන්

කොඳුඇට පෙළක් (කශේරුකාවක්) දරන සතුන් පෘෂ්ඨවංශීන් ලෙස හැඳින්වෙන බව අපි දනිමු. ඔවුන් ජීවන චක්‍රයේ කිසියම් අවධියක පොදු ලක්ෂණ පෙන්නුම් කරයි. ඔවුන්ගේ ව්‍යුහමය ලක්ෂණ පදනම් කර ගෙන නැවත කාණ්ඩවලට බෙදනු ලැබේ.

1. මැමේලියා (Mammalia) ක්ෂීරපායීන්
2. ආවේස් (Aves) පක්ෂීන්
3. රෙප්ටීලියා (Reptilia) උරගයින්
4. අම්ෆිබියා (Amphibia) උභය ජීවීන්
5. පිස්කෙස් (Pisces) මත්සයින්

### ■ සිංහරාජයේ වෙසෙන ක්ෂීරපායී සතුන් :-

ශ්‍රී ලංකාවේ ක්ෂීරපායී විශේෂ මුළු ගණන 85ක් වන අතර ඉන් විශේෂ 40ක් පමණ සිංහරාජයෙන් හමුවීම විශේෂ ලක්ෂණයකි.

වෙනත් වර්ෂා වනාන්තර මෙන්ම සිංහරාජ වනාන්තරයේද විශාල සතුන් ජීවත්වන බව පෙනී යන්නේ උන්ගේ වසුරු, පා සටහන් හා නාදකිරීම් වැනි සාක්ෂිවලිනි. පාසටහන්වල අනුරූ සිංහරාජ අධ්‍යාපන හා තොරතුරු මධ්‍යස්ථානයේ තබා ඇත. මොවුන් දැක ගැනීම දුෂ්කර වන්නේ වනයේ භූවිෂමතාව හා වෘක්ෂලතාදියේ ස්වභාවය නිසාය.

ඔබ සිංහරාජ ලෝක උරුම වන අරණේ සංචාරයක යෙදෙන්නේ නම් මඟ පෙන්වන්නෙකු ගේ සහාය ඇතිව වනය තුළට ගමන් කළ හැකිවේ. එහිදී ශබ්දකිරීම හා ශාකවලට හානි කිරීම නොකළ යුතු අතර කොළ පැහැයට හා දුඹුරු පැහැයට හුරු ඇඳුම් ඇඳ සිටීම ඔබද පරිසරයට අනුගතවීමක් ලෙස සැලකිය හැකිය. හෙමින් සීරුවේ ඉදිරියට යද්දී ඔබට විවිධ ආකාරයේ සතුන් හා ශාක හමුවේ.

සිංහරාජ වනයේ සතුන් අතරින් වඩාත් පහසුවෙන් දැකගත හැකිවන්නේ කළු වඳුරායි. (Presbytis Senervetulus) කළු වඳුරෝ සාමාන්‍යයෙන් 10ක් හා 12ක් අතර සංඛ්‍යාවකින් සැදුම් ලත් රංචු වශයෙන් සිටිනු දක්නට ලැබේ. ඔවුන් ශාක උඩු වියනේ සැරිසරති. ඔවුන්ගේ කෑගැසීම් ශබ්දය කිලෝමීටරයක පමණ ඈතට වුවද ඇසේ.

ඇලි වඳුරන්ද කලාතුරකින් හමුවිය හැකිය. රිලවුන් වන අභ්‍යන්තරයේදී දක්නට අපහසු වුවත් වනය මායිම් ප්‍රදේශවල වඩා පහසුවෙන් දක්නට ලැබේ. වඳුරා හා රිලවා ශාක භක්ෂකයෝ වෙති. විමසිලිලෙන් බැලුවහොත් ඔවුන් එකිනෙකා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව ඇති බවත් රැහැනට නායකයකු සිටින බවත් නායකයා විසින් අනෙක් අය රැක බලාගන්නා බවත් පැහැදිලි වේ. එක් සාමාජිකයකුට අනතුරක් වී නම් අනෙක් අය ඔහුව බේරාගැනීමට වෙර දරන බවද තේරුම් ගත හැකි වේ.

ලේන් විශේෂ අතරින් කළු දඬුලේනා (Ratufa macroura melanochra) රතු ඉරි සහිත කැලෑ ලේනා, අළු ඉරි සහිත කැලෑ ලේනා වැනි ලේනුන් දැක ගත හැකිය.

මීයන් විශේෂ කීපයක් දක්නට ලැබේ. ලංකා දම්වර්ණ මීයා, (Sri Lanka Chiensis) කටුමීයා, විශාල ඌරුමීයා, වෙල්මීයා, ලංකා දිග නකුටැති හික්මීයා, හෝස්ෆිල්ඩ් ගේ හික් මීයා ඉන් කිහිප දෙනෙකි.

රාත්‍රී කාලය තුළ සැරිසරන නිශාචර වර්ගයේ සතුන් ද හමුවේ. කලවැද්දා, උරුලෑවා, දුඹුරු මුගටියා, වයිරම් සහිත බෙල්ලක් ඇති මුගටියා, ගල් මුගටියා, දිය බල්ලා. ඉත්තෑවා, කැබැල්ලෑවා වැනි ක්ෂීරපායීන්ද හමුවේ.

කිරිවවුලා ( Rhinolophus rouxi ) කොටිකන් වවුලා, යක් වවුලා වැනි ක්ෂීරපායී පක්ෂීන්, අඳුරු ස්ථානවල දැකගත හැකිවේ.

ක්ෂීරපායී ගනයට අයත් විශාල වන සත්තු සාමාන්‍ය සිරිතක් වශයෙන් භූමිය මතම වාසය කරමින් භූමියෙන් අහුලාගෙන කමින් ජීවත් වෙති. වල් ඌරන්, ගෝනන් මීමින්නන් හා වැලි මුවන් වැනි ශාක භක්ෂකයින් හා සර්ව භක්ෂකයින් මේ කණ්ඩායමට අයත් වේ.

විශාල ක්ෂීරපායින් අතර අලියා (Elephas Macimus) දිවියා (කොටියා) කොළ දිවියා (හඳුන් දිවියා) දුඹුරු තිත් දිවියා වැනි සතුන් සිටින්නේ ඉතා සීමිත ප්‍රමාණයක් බැව් දැන් වාර්තා වේ.

### ■ සිංහරාජයේ පක්ෂීන්

සිංහරාජය තුළ පක්ෂීන් විශේෂ 147 ක් පමණ දක්නට ලැබෙන බව වාර්තා වී ඇත. ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂි විශේෂ 26ක් පමණ සිටින අතර ඉන් විශේෂ 25ක් පමණ සිංහරාජයේ දක්නට ලැබීම විශේෂ සිද්ධියකි. ඒ සිංහරාජ වාස භූමිය තුළ විවිධ පරිසර නිර්මාණය වී තිබීම නිසාය. වනය තුළ ජීවත් වන්නේ මුහුදු මට්ටමෙන් මීටර් 300 සිට මීටර් 1500 දක්වා උස වූ අඛණ්ඩ වන භූමියක් වන මෙහි ඒ සියලුම පක්ෂි විශේෂයන්ට යෝග්‍ය වූ පරිසර විවිධත්වයක් තිබෙන හෙයිනි.

කළු සිළු කවුඩා, ලංකා රතු දෙමලිච්චා, රන් නළල් කොට්ටෝරුවා, ලංකා සිතාසියා, බැම් කහ ගුළුගුඩුවා, ලංකා හිස සුදු ශාරිකාවා හැම විටම වාගේ දක්නට ලැබෙන පක්ෂිහු වෙති.

ආවේණික විශේෂ මෙන්ම අනෙක් පක්ෂි විශේෂ කිහිපයක්ද සිංහරාජය තුළ වාර්තා වී ඇත. සිතාසියා (White eye) පෙති ගෝමර සිරාසිකයා (Scaly thrush) මයිලගොයා (Wood pigeon) අඳුරු නිල් මැසිමාරා (Dusky blue flycatcher) හා පිත කන් කොණ්ඩයා ඉන් කිහිපදෙනෙකි.

සිංහරාජයේ බටහිර කොටස තුළ වාර්තාවී ඇති පක්ෂීන් අතරින් 13% පමණ සාංක්‍රමණික පක්ෂිහු වෙති. කරුලු විශේෂ වැඩි සංඛ්‍යාවක් පරිසර විශේෂිත බැවින් වනයට යම් බාධාවක් සිදු වුවහොත් එම පක්ෂීන් වඳවී යා හැකිය. පක්ෂීන් සුරැකීමේ ජාත්‍යන්තර මණ්ඩලය විසින් සකස් කරන ලද වඳවී යෑමේ තර්ජනයට මුහුණ පා සිටින පක්ෂීන් පිළිබඳ 1989 ජාත්‍යන්තර නාමාවලියට සිංහරාජය පක්ෂි විශේෂ කීපයක් ඇතුළත් කර ඇත. කැහිබෙල්ලා (Blue Magpie) හිස සුදු ශාරිකාවා (White headed starling) හිස අළු දෙමලිච්චා, බට ඇටි කුකුලා, වතරතු මල් කොහා, මයිල ගොයා ඉන් කිහිප දෙනෙකි.

ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන වලිකුකුළා හා ගැහැණු සතා නිතර නිතර හමුවේ. සංචාරකයන් ගැවසෙන ස්ථානවල ද සුලබව දක්නට ලැබේ.

වනය තුළ සැරිසරන්නට දක්නට ලැබෙන හිමිරිතම අත්දැකීමක් වන්නේ විවිධ විශේෂවලට අයත් පක්ෂීන් ගෙන් සැදුම්ලත් කුරුලු රැන් දැක ගැනීමය. මෙසේ මිශ්‍ර රංචු වශයෙන් සැරිසැරීම ආහාර අහුලා ගැනීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කර ගැනීම හා සතුරු උවදුරු වලින් ආරක්ෂාවීමේ උපායමාර්ගයක් යැයි විශ්වාස කෙරේ. කන් බිහිරි කරවන තරම් නාදයක් ද ශ්‍රවණය කළ හැකිය. සිංහරාජය තුළ මෙවන් කුරුලු රංචුවක යටත් පිරිසෙන් පක්ෂීන් 100 පමණ ඇතැයි දළ වශයෙන් ගණනය කර ඇත. මෙම රංචුවල මඟ පෙන්වන්නා හා ආරක්ෂකයා ලෙස කවුඩා ක්‍රියා කරනු ඇතැයි නිරීක්ෂකයෝ පවසති. කවුඩා ආහාර සෙවීම නොකරන අතර අනෙකුන් සොයාගත් ආහාර ක්ෂණිකව ගිලදමා නැවත ආරක්ෂාව හා මඟ පෙන්වීමෙහි යෙදෙන බවද විශ්වාස කෙරේ.

දඬු ලේනුන්, වන ලේනුන්, කළු වඳුරන් හා මීමින්නන් වැනි සත්තුද නිතරම වාගේ මේ කුරුලු රංචු සමඟ ගැවසෙති.

රොබට් එම්. එදිරිසූරිය මයා
අ.පො.ස. (සා/පෙළ) විද්‍යා ගුරුතුමා

වෙහෙස වී වැඩ කිරීමෙන් ශක්තිමත් චරිතයක් ගොඩනැගේ. (කියමනකි)

# සිත් රූ



එච්.ඒ. හිමහංසි - 6 - F



ආර්.එම්.සී. භාග්‍යා සඳමිණී බණ්ඩාර - 7 - A



ඩබ්.එම්. තිලක්ෂි අයෝධ්‍යා- 7 - E



ජේ.පී. ගීත්මා අරුණදි - 6 - F



කවීෂා ෂෙනාලි - 6 - A



ගගනි විහාරා - 5 - B



ඩබ්.පී. සංජුලා නුවංගි - 7 - A



පී.ඒ. සදෙව්මා තිසාරි 6 - C



මෙතාෂා දෙව්ලිනි - 7 - G



සහන්යා රන්දි - 5 - C



සෙනීෂා
4 - A



සඳීරා ද සිල්වා
6 - B



ඒ.කේ. යසිසි අමරසිංහ
4 - B



යෙනුලි බිනාරා වලිසුන්දර
7 - A



සඳමිණි
6 - E

ඔබට යම් හැකියාවක් ඇත්නම්, එය ආරක්ෂා කරගන්න. (කියමනකි)

# තෙමසක සැමරුම් අතරින්....



බෞද්ධ සංගමයේ නිල ලාංඡන පැලඳවීම.....



විද්‍යාලයීය තොරතුරු තාක්ෂණ දිනය....



ජාතික නිදහස් දින සැමරුම.....



බාස්කට් බෝල් ජයසංකේත ප්‍රදානය......



කුමාරතුංග මුනිදාස ගුණානුස්මරණ ළමා වැඩසටහන.....



පෙර පොහොය වැඩසටහන.....

# සිංහරාජයේ වගතුග පිටුවෙන්.....



දඬු ලේනා



කළු වඳුරා



මුවා



රිලවා



වතරතු මල්කොහා



වළිකුකුළා

අන් අයගේ වාසනාව ගැන සිතන විට ඔබේ වාසනාව හමුවේ. (කියමනකි)



# පන්හිඳ



## අම්මා

දස මස කුස දරා මා හැදු වැඩු අම්මා
ලේ කිරි කර පොවා මට අත දුන් අම්මා
යන යන තැනට මා එක්කන් ගිය අම්මා
මතු බුදු වන්නෙ අම්මයි මගෙ සුදු අම්මා

අම්මා නොකා මට කන්නට දුන් අම්මා
කැත කුණු අතගගා මා හැදු වැඩු අම්මා
දුක සැපෙදී සැමදා ළඟ සිටි අම්මා
නිවන් දකිත්වා ආදර මගෙ අම්මා

**සුභාෂි නෙත්මිණී**
6 - E



## ජල සම්පත සුරකිමු.

ජලය යනු සියලු ජීවීන්ගේ මූලික අවශ්‍යතාවන්ගෙන් එකකි.

පානය කිරීම, ආහාර සෑදීම, දිය නෑම, රෙදි සේදීම වැනි අවශ්‍යතා සඳහා ජලය අවශ්‍ය වේ.

කිසිදු ශාකයකට හෝ ජීවියෙකුට ජලය නොමැතිව ජීවත්විය නොහැක.

ජලය නොමැති විට පරිසරය උණුසුම් වී ලෝකය විනාශ වීමට ඉඩ ඇත.

එම නිසා ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම අපගේ වගකීම වේ.

**අයි.යූ. චනලි නුවන්දරා**
4 - B



## MY TEACHER

**My teacher is Mrs. Kanthi**
**She is fifty years old.**
**She lives in Balummahara.**
**She is tall and fair.**
**She is kind.**
**She has long hair.**
**She is beautiful.**
**She comes to school early.**
**She loves us.**
**I love my teacher.**

**Senuli Pehara Jayawardhana**
**4 - C**

## My Garden

Red flowers blue flowers
all around
butterflies butterflies
come over here.

big trees small trees
hear and there
green hear green there
everywhere



yummy fruit to eat
over hear
filling my tummy up
Yum! Yum ! Yum!

**Sehasna Kottahachchi - 5 - A**

## සහෝදරත්වය

දෙදෙන ගව් ගණනක් දුරයි
නමුදු දැනෙයි සිත්වල සිතුම්
දැවටෙයි ළඟම එකිනෙකාගේ සුසුම්
අවදි කරවයි ළමා කල හැඟුම්

නිතර ළං නොවන්නට ගතින්
වෙන් වුණත් ඔබ මා ඉතින්
අත පොවන මානෙයි සිතින්
එකිනෙකා ගැන සිහි කරමු බැතින්

**චම්පා රණබාහු මිය**



## My country

I was born in a small island. It is my motherland Sri Lanka is in the Indian Ocean. Our nearest neighbour is India.

Sri Lanka is divided in to two main parts. They are up country and low country.

In up country there are many green tea estates, long rivers, beautiful waterfalls and high mountains. The climate is cool and healthy in up country. There are many plains in low country. We can see coconut estates and paddy cultivation. In the past many kings ruled our country.

Our present president is Mr. Maithripala Sirisena. Mahaweli is the longest river and the Bambarakanda is the highest waterfall. Sri Lanka is famous for tea, rubber, coconut and gems. I love my country dearly. I am proud to be a Sri Lankan.

**Hashmi Achinthya**
**7 -D**



## දියණියේ

දිනෙක මතුදා
දිරිය දියණියක ලෙසින්
පා මුලට එන අභියෝගයන්
ජය ගන්න දියණියේ....
නුඹට හැකිය
ලොව තනන්න
නිසි ලෙසින් දුවණියේ....
බැරිය මට කරගන්න
නොහැක මට කරගන්න
නොහැක මට සියලු දේ
සිත සිතා වැලපුණොත්
නුඹෙ පරාජය එයයි
දැන ගනින් දියණියේ
විදු බිමේ නම රකින
හැදූ මවගෙ ගුණ දකින
අභියෝග ජය ගන්න
සැම අතින් ශක්තිමත්
දියණියක්ම වන්නට
දිරි ගනින් දියණියේ....

**ෂනාලි සත්සරණි**
12 - K කලා අංශය

## මගේ රට

මගේ රට ශ්‍රී ලංකාවයි. එය ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙස හඳුන් වනු ලැබේ. මගේ රටේ විවිධ ජාතීහු සමගියෙන් ජීවත් වෙති. මගේ රටේ ස්වාභාවික සුන්දර පරිසරයක් තිබේ. එහි අග නගරය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේය. මගේ රටේ ප්‍රධාන වගාවන් ලෙස තේ, පොල්, රබර් වගා කරනු ලැබේ. මගේ රටට දිගු ඉතිහාසයක් ඇත. මගේ රටට මම ආදරය කරමි.

**අනුමි දුලාදී**
4 - B



11 පිටුවට

10 පිටුවෙන්

## කවි අසිපතෙන් නැගුණ රණ හඬින් සිංහලය අවදිකළ......

# එස්. මහින්ද හිමි



පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය වන අපගේ මාතෘ භූමියට, සිංහල භාෂාවට හා බුදු දහමට අමිල වූ සේවාවක් කරමින් සිංහලයන් තුළ ජාතික හැඟීම් පුබුදුකරවීමෙහිලා මහත් වෙහෙසක් දැරූ විදේශිකයන් අතුරෙන් ප්‍රමුඛස්ථානයක් ලැබෙන්නේ ටිබෙට් ජාතික සිකීම් මහින්ද හිමියන්ටය. සිංහලයෙකු නොවූව ද ලක් බිමෙහි නොඉපදුණ ද සිංහල ජාතිය, බුදු දහම පිළිබඳව ක්‍රියා කළ මහින්ද හිමියෝ සිය ප්‍රතිභාපූර්ණ කවීත්වය උපයෝගී කරගෙන නිදා සිටි සිංහලයන් අවදි කිරීමේ පුරෝගාමී මෙහෙවරක නිරත වූහ.

වර්ෂ 1901 දී එස්. කේ. ටෂිනම්ගල් කුමාරයා හිමාලය කඳුවැටියට යාබද සිකීම් නම් කුඩා ග්‍රාමයේ දී මෙලොව එළිය දුටුවේය. ඉන් වසර 13කට පසු එනම් 1914 දී ටෂිනම්ගල් කුමරු ජර්මන් ජාතික හිමිනමක් සමඟ ලක්දිවට පැමිණියේ අධ්‍යාපනය සඳහාය. දක්ෂ සිසුවෙකු වූ එතුමා දොඩන්දූව ශ්‍රී ශෛලබිම්බාරාමයේ සිට රත්මලානේ පුරාණ විහාරාධිපතිව සිටි ධර්ම කීර්ති ශ්‍රී ඉන්ද්‍රජෝති හිමියන්ගේ ශිෂ්‍යයකුව සිටියදී මහණ උපසම්පදාව ලැබීය.

1935 දී ''ලංකා මාතා'' නමැති විශිෂ්ට කාව්‍ය ලියමින් සිය කවීත්වය මැනවින් ඉස්මතු කළ උන් වහන්සේ අඛණ්ඩව කවි ලියුවේ අසරණව සිටි සිංහලයාට වහල් බැම්මෙන් මිදී නිවහල් වීමට ධෛර්යය දීමටය.

ඔවා මුතු දම නැමති කාව්‍යය මාලාව ඇතුළු කාව්‍ය ග්‍රන්ථ 11 පමණ පළකරමින් සාහිත්‍ය පෝෂණය කළ අතර ළමා පරපුරටත් උන්වහන්සේ පොත් ලියූහ.

අප සිරිලකට අනර්ඝ වූ සේවාවක් සිදුකර වර්ෂ 1951 ක් වූ මාර්තු මස දාසය වන දින උන්වහන්සේ අප අතරින් සමුගත් සේක.

**සිතුම්දි සනුල්යා**
**7 - F**

# මගේ පවුල

මට පොඩි පවුලක් තිබෙයි
අම්මා තාත්තා අයිති වෙයි
පොඩි මල්ලිත් අයිති වෙයි
අපි ඔක්කොම එකමුතුයි

මගේ අම්මා හරිම හොඳයි
දුකේදි මගෙ ළඟින් හිඳියි
අපිවත් යහමගට යවන
මගෙ අම්මට බුදු සරණයි!!!

තාත්තා අපෙ ගෙදර රජුයි
හැමදේ මට කියලා දෙයි
නොදන්න දේ කියලා දෙන
මගෙ තාත්තට බුදු සරණයි!!!

මගෙ මල්ලී හරි හොඳයි
හැබැයි ටිකක් හෙම දඟයි
වත්ත වටේ දුව පනියි
අල්ලන් සෙල්ලම් කරයි

**එල්.වයි. අමායා නෙත්මලී**
**7 - D**

# The kandy Perahera

The kandy Esala Perahera is the most beautiful perahera in Sri Lanka. The perahera was started by king Kirthi Sri Rajasinghe. The starting event of the Esala Perahera is planting of the Kap. The first time in the perahera is the sound of the whip crackers. It is followed by the flag bearers. The Peramune Rala is th one who sits on the first elephant in the perahera. After that so many groups of dancers, drummers beautifully dressed add beauty to the perahera. The tusker carrying the casket walks majestically on the pavada. The Diyavadana Nilame and other Nilames follow the tusker. There are hundreds of elephants that can be seen in the perahera. This perahera is the most beautiful perahera I have ever seen.

**H.A. Dewni Nesanga**
**7 - A**



# My pet



My pet is a cute tiny pet. It is a cute pet. Its frizzes as snow. It is very obedient to me. My pet is a little dog. Its name is Twinkle. My pet has a small Kennel. That kennel is made by father to Twinkle.

My Twinkle likes to eat bones, meat and it likes to drink milk. It is very innocent and loves me very much but Twinkle barks to vistors and thieves, I love my pet very much.

**Nuwanjana Darani**
**Grade 7 - G**

# මගේ මල්ලියා



හරිම හොඳයි වෙලාවකට
හරිම දඟයි වෙලාවකට
හරි හුරතල් වෙලාවකට
හා පැටියෙක් වෙලාවකට

පුංචි මුහුණ නපුරු කරන්
නිතරම අම්මා රවටන්
ඕනෑ සියලු දේම අරන්
හිනැහෙයි මුව සතුටු නගන්

කිසිවක් නැහැ හිතට ගන්නෙ
සැහැල්ලුවෙන් දිවි ගෙවන්නෙ
කීකරු වී ඉගෙන ගන්නෙ
ගුරුතුමි හිත දිනාගන්නෙ

**ජී.ජේ.ඩී. නෙසංගා මුතුනදී**
**7 - A**

# අම්මා



දස මස කුස තුළ රදවා අම්මා
අනේක දුක් වින්දා මගෙ අම්මා
රසවත් ආහර අත්හළ අම්මා
මා ගැන විතරයි හිතුවේ අම්මා

ඉගෙන ගන්න අත දෙන මගෙ අම්මා
ලෙඩක් හැඳුණ විට අඬනව අම්මා
හරියට කලබල වන මගෙ අම්මා
ගෙදර බුදුන් ලෙස සලකම් අම්මා

**ජේ.ටී. ඔනෙලි අයත්මී ජයලත්**
**7 - A**

## *TOTAL HEALTH*

**Total Health means not only** free from diseases but complere of physical, mental, social and Spirilual well being



**Features of physical well being.**



Active
Immunity
physical Fitness
Proper B.M.I

**Factors needed for physical well being**



Fresh air
Clean water
Healthy foods
Hygiene and Sanitation
Sports and exercises
Adeaquate rest and sleep

**Thisali Sanara Sayandi Jayarathna**
**Grade 6 - E**

12 පිටුවට

11 පිටුවෙන්

## සමනලයෝ

සමනලයෝ රෑන් රෑන් //
මාගේ වත්තට ඇවිල්ලා ඇවිල්ලා
චූටි හොටින් රොන් බිඳු බිඳු
බොති පොඩි පොඩි සමනලයෝ //

සමන් පිච්ච මල් වැලේ
තිබුණු පුංචි මල් පොඩිත්ත //
සමනලයෙකු පැමිණ එතැන
රොන් බිව්වා මා දැක්කා

සමනලයෝ....

ඉද්ද, පිච්ච, අරලිය මල්
ගොඩක් තිබුණි මගෙ වත්තේ//
සමනලයෝ සමනලියෝ
රොන් බොන සැටි මා දැක්කා

සමනලයෝ....



**අයන්සා බණ්ඩාර**
**6** - G

## මට හිමි වී ඇති යුතුකම්

දසමසක් මා කුස තුළ දරලා
මෙලොවට බිහි කරලා
ලේ කිරි කරලා මට පොවලා
මා නිදි කරවාලා
දහසක් දුක් විඳ මා ලොකු කරලා
පැතුමන් ඇත පතලා

දිනෙන් දිනම මා හොඳින් ඉගෙනගෙන
හොඳ මිනිසෙක් වෙන්නම්
මගෙ මෑණි සහ මගේ පියා හට
සැමදා සලකන්නම්
හොඳ පුරවැසියෙක් වීලා රටටම
මම සෙත සලසන්නම්
එතකොට අම්මේ මගේ පියාණෙනි
ඉටු වී ඇත ඔබේ මා ගැන ඇති
පැතුමන්.....

**කේ.එම්.එස්. ඔවින්දි කෝණාර**
**7** - F

## මගේ නංගි

- මගේ නංගීගේ නම, ඉනුරි.
- ඇයගේ විනෝදාංශය, මාත් සමඟ සෙල්ලම් කිරීමයි.
- ඇයගේ වයස අවුරුදු පහයි.
- මගේ නංගිගේ මූණ රෝස මලක් වගෙයි.
- මම ඇයව වඩා ගනිමි.
- මගේ නංගී සුදු පාටයි.
- ඇය හරිම ආසයි කිරි බොන්න.
- ඇය හරිම ලස්සනයි.



**මලින්සා**
**3** - B

## My Country Sri Lanka

**National tree - Na tree**
**National Flower - Blue Water Lily**
**National bird - Jungle Fowl**
**National game - Volleyball**

**Minuli Nimnara**
**3 - C**



## MY COUNTRY

My country is Sri Lanka. It is an island. Sri Lanka is in the Indian Ocean. The nearest country to Sri Lanka is India. This is an agricultural country. Most of the people are farmers. The capital of Sri Lanka is Sri Jayawardenapura Kotte. The population of my country is about twenty millions. There are several communities in Sri Lanka. They are the Sinhalese, the Tamils, the Muslims and the Burghers. The national flower of Sri Lanka is Blue water lily. The commercial city of Sri Lanka is Colombo. Coconut, rubber and tea are the main export crops. Sri Lanka gained independence in 1948 and it became a Republic in 1972. I love my country very much.

**Kushini Sandalika**
**6 - G**



## අප්පච්චී විදේශ ගත වූ දා



එදින අම්මා මා පාන්දර හතරට පමණ අවදි කළාය. ඇඳෙන් බැසගත් මම සාලයට ගියෙමි. එකවරටම මගේ නෙත ගැටුණේ සාලයේ මැද තිබෙන විශාල ගමන් මල්ලයි. අප්පච්චී විදේශගතවීම පිණිස සියල්ලම සූදානම් කර ඇති බව මට වැටහුණි.

අප්පච්චි ගුවන්තොටුපලට රැගෙන යාම සඳහා පැමිණි බාප්පාගේ මුහුණ ද මැලවී ඇති අයුරු මම දුටුවෙමි.

අයියා සහ මම අප්පච්චි ළඟ දණ ගසා වැන්දෙමු. අප්පච්චීගේ නෙතින් ගිලිහුණු කඳුළු බින්දුවක් මගේ හිස මත පතිත විය. අප්පච්චි, අම්මා අයියා සහ මම තුරුළු කරගෙන බොහෝ වේලාවක් හැඬුවේය. ඉන්පසු අප්පච්චී බාප්පා සමග අපට සමුදී පිටව ගියේය. අප්පච්චි නිවසින් පිටව ගිය පසු නිවස අඳුරු ගුහාවක් වැනි විය.

අම්මා, අයියා සහ මම අප්පච්චී පිටවී ගිය පසු ද බොහෝ වේලාවක් ඇඬුවෙමු. ඉන්පසු ටික වේලාවකින් අප්පච්චී ඇරලූ බාප්පා ද පැමිණියේ ය. අප්පච්චී කරදරයකින් තොරව ගුවන්යානයට ගොඩවූ බව බාප්පා පැවසුවේය.

මගේ අප්පච්චීට සම්මා සම්බුදු සරණ පතමින්, අප්පච්චි පැමිණෙන දිනය ද ඉතා ඉක්මනින් උදාවේවායි මම ප්‍රාර්ථනා කළෙමි.

**ආර්.කේ.ඩී. සඳරු රත්නායක**
**6 - A**

## උදෑසන අසිරිය

කුරුලු ගීත උදයම අපහට ඇසෙන
නැගිටිමු අපේ වේලාවත් දැන සොඳින
මුවකට සෝදා ගෙන නිති පන්සිල් රැගෙන
යමු පොත් රැගෙන අපෙ පාසල් වෙත ඉතින

උදෑසනම නැගිට්ට් දරුවෙනි ඔන්න
උදයම තිබෙන වැඩකටයුතු කරගන්න
අලසකමින් ඔබ බැහැරව සැරසෙන්න
කාලය බොහොම ටික බව ඔබ දැනගන්න

**දනාරා රාජකරුණා**
**6 - F**



## Trees

Trees make us live. Trees are our life. With out trees we can't live on the earth. They give us fruits, medicine, shelter, Wood and many things. We get oxygen to breath. Trees make the environment cool. We make furniture and build house with its timber. So we must plant more and more trees when we cut one. So let's protect trees.

**Sanuli Thasara Balasooriya**
**7 - D**

## විද්‍යා ප්‍රබන්ධය

# කාළු කුහරයක් ලුහුබැඳ...



නාසා ආයතනයේ ප්‍රධාන විද්‍යාඥ ආචාර්ය සැමුවෙල් බර්නාඩ් තවමත් ඉදිකිරීම් කුටිය තුළ වැඩ නිමවෙමින් තිබෙන තම නිපැයුම දෙස බලා සිටියි. ඔහුගේ මුවෙහි වූ තෘප්තිමත් මදහස සිය ප්‍රයත්නය සාර්ථක වීම පිළිබඳව හදවතේ වූ සතුට පිටතට කියා පාන්නක් විය.

''සර්'' යනුවෙන් කිසිවෙකු තමා ඇමතුවෙන් ඔහු තිගැස්සී ගියේය. ඔහුගේ ප්‍රධාන සහායක ජෝන්ස් ඔහු ඉදිරිපිට විය.

''සර්ව මුණ ගැහෙන්න කෙවින් සර් ඇවිත්''

''හොඳයි, කෙවින්ට මගෙ ඔෆිස් රූම් එකට එන්න කියන්න'' කියමින් සැමුවෙල් එදෙසට ඇවිද ගියේය.

''සැමුවෙල් මේ කරන්න යන දේ ගැන මගේ නම් ලොකු කැමැත්තක් නැහැ. හිතෙන්නේ නැද්ද මේක තමුන්ගේ ජීවිතේට අනතුරක් කියලා.?'' කෙවින් විමසුවේ කාර්යාලීය කාමරයේ අයිනක වූ කවුළුවෙන් පිටත බලාගෙනයි.

''කෙවින්, හැමදාමත් මේ වැටෙන හුස්මට වඩා මාව ජීවත් කළේ මගේ හිතේ කුතුහලය. ඉතින් ඒ කුතුහලය වෙනුවෙන් වැඩ කරන්න මං දෙපාරක් හිතන්නෙ නෑ.''

''මං නං කියන්නෙ, සැමුවෙල් අපි කරගෙන යන කියුරියොසිටි ප්‍රොජෙක්ට් එකට ජොයින් වුණොත් හොඳයි කියල. මොකද, විද්‍යාඥ මණ්ඩලයෙහි ජනාධිපතිතුමාගෙයි මේ හැමෝගෙමයි අවධානය තියෙන්නෙ එතන.''

''මං මගේ ප්‍රොජෙක්ට් එක කොහොමටත් අතරමග නතර කරන්නෙ නෑ කෙවින්, මං ජෝන්ස් එක්ක මේ දේ දිගටම කරනව.''

''එහෙමද? එහෙනම් මං ගිහින් එන්නම් මිස්ට සැමුවෙල්'' කෙවින් මාටෙන්ස් පැවසුවේ එතරම් හිත හොඳකින් නොවන බව සැමුවෙල්ට වැටහිණි. ඔහු කවදත් තමා සමග තිබුණේ තරඟයක් බවද ඒත් සමඟම ඔහුට සිහිපත් විය.

''කෙවින්''
කාමරයේ දොටුවෙන් පිටව යාමට සැරසුණු කෙවින් සැමුවෙල්ගේ හඬින් යළිත් හැරී බැලුවේය.

''අපි මොන ප්‍රොජෙක්ට් එක මොන විදියට කළත් ඒ හැම තැනකම දිදුලන්නේ මෙන්න මෙයා විතරයි.''

සැමුවෙල් සිය මේසය මත වූ කුඩා ඇමරිකන් කොඩිය පෙන්වමින් පැවසීය. කෙවින් ද මඳ සිනාවක් පළ කළේ ඊට එකඟ වෙමිනි.
පෘථිවියට බොහෝ ඈතින් පිහිටා තිබූ කුයිපර් වළල්ල දක්වාම තම පරීක්ෂණ මෙහෙයවමින් අභ්‍යාවකාශ ක්ෂේත්‍රයට දැවැන්ත මෙහෙවරක් ඉටු කළ සැමුවෙල් කර්නාඩ්ගේ මීළඟ පියවර වූයේ තවමත් අභිරහසක්ව පවතින කළු කුහරය ගවේෂණය කිරීමයි.

කළු කුහරයේ වූ විස්මිත ආකර්ෂණ බලය ඔහුගේ මනස පුදුමයට පත් කර තිබිණි. කළු කුහරයට ඇති කාලය ඇද ගැනීමේ බලය නිරීක්ෂණය කර ඒ ඔස්සේ කාල යන්ත්‍රය නිර්මාණය කිරීම ඔහුගේ අරමුණ විය.

නමුත් ඔහුගේ මෙම අදහස හා ඔහු ඊට උපයෝගී කර ගන්නා යානය අනෙකුත් විද්‍යාඥයන් දුටුවේ විකාරයක් ලෙසයි. මේ අයුරින් නොයෙකුත් බාධක මධ්‍යයේ වුවත් තම අධිෂ්ඨානය මුදුන්පත් කර ගැනීමට ආචාර්ය සැමුවෙල් පසුබට නොවීය.

රෝම කැලැන්ඩරයට අනුව වර්ෂය 2021 විය. දුරුතු මාසයේ එක් දිනයක නාසා ආයතනය ඉදිරිපිට ආචාර්ය සැමුවෙල්ගේ ''රිවෙන්ජර් 1012'' යානය ගුවන් ගත කිරීමට සියලු කටයුතු සූදානම් කර තිබිණි.

අනෙකුත් විද්‍යාඥයන් සිතුවේ මේ ඔවුන් සැමුවෙල් හා ජෝන්ස් දකගන්නා අවසන් මොහොත බවයි. සැමුවෙල්ගේ ''රිවෙන්ජර්'' යානයේ කාර්යශූරත්වය පිළිබඳ අබමල් රේණුවක තරමවත් දෙයක් නොදත් ඔවුන් සිතුයේ කළු කුහරයේ ආකර්ෂණ බලයට සැමුවෙල් මොහොතකින් විනාශ වී යනු ඇති බවයි.

සැමුවෙල්,
විෂ් යූ ඕල් ද බෙස්ට්!
ගෝඩ් බ්ලෙස් යූ!

කෙවින් ඇතුළු විද්‍යාඥයින් පිරිස සිය සහෝදර විද්‍යාඥයාට සුභ පැතුවේ එක හඬිනි.

මොහොතකින් සැමුවෙල් හා ජෝන්ස් රැගත් ''රිවෙන්ජර් 1012'' ගුවන්ගත වූයේ මුළු ප්‍රදේශයම විශාල දුමාරයකින් වසා දමමිනි.

දින සතිවලට ද සති මාසවලටද මාස වර්ෂවලටද හරවමින් කාලය අධිවේගයෙන් පියඹා ගියේය. සැමුවෙල්, ජෝන්ස් හා රිවෙන්ජර් පිළිබඳ මතකය සියලු සිත්වලින් දුරස්ව ගියේය. කෙවින් මාටෙන්ස් ප්‍රමුඛ විද්‍යඥ පිරිසගේ ''කියුරියෝසිටි'' ව්‍යාපෘතිය සාර්ථකව නිමවෙමින් වර්ෂ 2042 වන විට අඟහරු මත ජනාවාස පිහිටුවන ලදී. පෘථිවි වාසීන්ගෙන් බොහෝමයක් අඟහරු වෙත ගෙන යනු ලැබූ අතර ඔවුහු එහි සිට නව ජීවන රටාවක්ට හුරු වූහ. කෙවින් ඇතුළු විද්‍යාඥ පිරිසද අඟහරු මත ''නිව්ලීඩ්ස්'' නමින් තම අභ්‍යාවකාශ මධ්‍යස්ථානය පිහිටුවූහ.

''සර්... අනවසරයෙන් අභ්‍යවකාශගාමියෙක් අඟහරුවලට ඇවිත්. අපේ ඇමරිකන් කොඩිය දකලලු ඇවිත් තියෙන්නේ.''

''මොනව? ඔහොම ඉන්න මං විනාඩියෙන් එන්නම්.'' යැයි සේවකයාට පැවසූ කෙවින් මොහොතකින් අභ්‍යාවකාශ මධ්‍යස්ථානයේ ප්‍රධාන පිවිසුම් දොරටුව දෙසට ගමන් කළේය.

වර්ෂ 21කට ආසන්න කාලයක් ගත වී තිබුණද තම පැරණි සගයා හඳුනාගැනීමට කෙවින්ට අපහසු නොවීය.

''සැමුවෙල්, එහෙනම් ඔයා ජීවත් වෙනවා. කෝ අපේ ජෝන්ස්? කොහොමද ඔයාගෙ ප්‍රොජෙක්ට් එක?''

කෙවින්, මං කළු කුහරයට යන අතරමග ජෝන්ස් මිය ගියා. එයාගෙ නැති වීමත් එක්ක මට තවත් මේ දේ කරගෙන යන්න බැරි වුණා. කළු කුහරයට ගිය ගමන් මට එන්න සිද්ධ වුණා. ඒත් මට හුඟක් සතුටුයි. මෙච්චර ඉක්මනට අඟහරුවලට ජීවය ගෙනාපු එක ගැන.''

''ඉක්මනට? දැන් අවුරුදු විසි ගාණකුත් ගත වෙලා ඉවරයි සැමුවෙල්'' එසේ කියත්ම ක්ෂණයකින් යමක් සිහි වීමෙන් කෙවින් සැමුවෙල් දෙස විමසිල්ලෙන් බැලීය. මේ තවමත් සිටින්නේ වසර වසි ගණනකට පෙර සිටි සැමුවෙල්මය නමුත් තමා වසර විසි ගණනකට පසු වියපත් වී ඇත. එසේනම්.....

''සැමුවෙල්, ඔයා ඒ දේ කළා. කළු කුහරය ඔයාගෙ කාලයත් ඇදගෙන ඉවරයි. අපිට දැන් කාල යන්ත්‍රය හදන්න පුළුවන්.''

කෙවින් පැවසුවේ සිය සගයා වැළඳගනිමිනි.

ඇමරිකන් ධජය ආඩම්බරයෙන් ''නිව්ලීඩ්ස්'' අභ්‍යවකාශ මධ්‍යස්ථානය මත ළෙලදෙමින් පැවතිණි.

පී.ආර්. මන්දිරා ෂෙහානි 12-B (ගණිත අංශය)

අරමුණකට අනුව ජීවත් වන්නා ශ්‍රේෂ්ඨ සහ කීර්තිමත් ද වේ. (මොන්ටේග්නි)



# විශ්ව භාෂා

## にほんご නිහොන් ගො

| | | |
|---|---|---|
| おはようございます | ඔහායෝ ගොසයිමස් | - සුභ උදයක් |
| こんにちは | කොන්නිචිවා | - සුභ දවසක් |
| さようなら | සයනෝරා | - සමුගනිමු |
| こんばんは | කොම්බාන්වා | - සුභ සැඳෑවක් |
| おやすみなさい | ඔයසුමිනසයි | - සුභ රැයක් |
| おめでとうございます | ඔමෙදෙතෝ ගොසයිමස් | - මම ඔබට සුභ පතමි |
| ありがとう | අරිගතෝ | - ස්තුතියි |
| ほんとうに ありがとう | හොන්තොනි අරිගතෝ | - බොහොම ස්තුතියි |
| また あした | මතා අශ්තා | - හෙට හමුවෙමු |
| また おめに かかりましょう | මතා ඔමෙනි කකරිමෂෝ | - නැවත හමුවෙමු |

Anulya Vidushini
7 - D

## A Dialouge

王小云 :- 林娜，你好！
Wáng xiǎoyún :- Lín Nà, Nǐ hǎo!

林娜 :- 你好！王小云，这是谁？
Lín Nà :- Nǐ hǎo! Wángxiǎoyún, zhè shì shéi?

王小云 :- 这是我的朋友，是马大为。他是记者。
Wáng xiǎoyún :- zhè shì wǒ de péngyou, shì MǎDàwéi. tā shì jìzhě.

林娜 :- 你好，马大为。
Lín Nà :- Nǐ hǎo, MǎDàwéi.

马大为 :- 你好，林娜。
MǎDàwéi :- Nǐ hǎo, Lín Nà.

王小云 :- 林娜，今天你有时间吗？
Wáng xiǎoyún :- LínNà, jīntiān nǐ ou shíjiān ma?

林娜 :- 很抱歉，今天我很忙。为什么？
Lín Nà :- Hěn bàoqiàn, jīntiān wǒ hěn máng. Wèishénme?

马大为 :- 今天我们都去看京剧；好吗？
MǎDàwéi :- jīntiān wǒmen dōu qù kàn jīnjù; hǎo ma?

林娜 :- 太好了！京剧很有意思。我也很爱看京剧。
Lín Nà :- tài hǎo le! jīnjù hěn yǒuyìsi. wǒ yě hěn ài kàn jīnjù.

王小云 :- 行，我们去明天可以吗？
Wángxiǎoyún :- xìng, wǒmen qù míngtiān, kěyǐ ma?

林娜 :- 可以！明天什么时候去？
Lín Nà :- kěyǐ! míngtiān shénme shíhou qù?

马大为 :- 明天下午去；好吗？
MǎDàWéi :- míngtiān xiàwǔ qù; hǎo ma?

林娜 :- 很好！
Lín Nà :- Hěn hǎo!

### සිංහල පරිවර්ථනය

**වංග් ෂියා(ඕ) යුන් :** ලින්නා ඔබට කොහොමද?
**ලින්නා :** ඔබට කොහොමද වංග් ෂියා(ඕ) යුන්, මේ කවුද?
**වංග් ෂියා(ඕ) යුන් :** මේ, මගේ යාළුවෙක්. ඔහු වාර්තාකරුවෙක්.
**ලින්නා :** කොහොමද..... මාදාවෙයි.
**මාදාවෙයි :** කොහොමද..... ලින්නා.
**වංග් ෂියා(ඕ) යුන් :** ලින්නා, අද ඔයාට විවේක වෙලාවක් තියෙනවද?
**ලින්නා :** ගොඩක් කනගාටුයි, අද මම ගොඩක් කාර්යබහුලයි. ඇයි?
**මාදාවෙයි :** අද අප දෙන්නම බීජිං ඔපෙරාවක් බලන්න යනවා. හොඳයිද?
**ලින්නා :** ගොඩක් හොඳයි.! බීජිං ඔපෙරා ගොඩක් සිත් ඇදගන්නාසුළුයි. මමත් ගොඩක් කැමතියි බීජිං ඔපෙරා බලන්න.
**වංග් ෂියා(ඕ) යුන් :** හරි, අපි හෙට යමු, පුළුවන්ද?
**ලින්නා :** පුළුවන්,! හෙට කීයටද යන්නෙ?
**මාදාවෙයි :** හෙට හවසට යමු, හොඳයි.!
**ලින්නා :** ගොඩක් හොඳයි.!

H.A. Nimna Sammani
12 - K

# ඔබට ඔවුන් වෙනුවෙන් යමක් කළ හැකියි.

එම ධනවත් තරුණයා ලොව බොහෝ රටවල නිදහසේ සංචාරය කළා. පිය උරුමයෙන් ලැබුණ යස ඉසුරු ඔහුට එහෙම ජීවිතයක් ගත කරන්න මග පෑදුවා. එංගලන්තය, ඇමරිකාව, ප්‍රංශය, කැනඩාව, වගේ රටවලට ඔහු ගොස් තිබුණා. ඔන්න ඔහුට ප්‍රථම වතාවට ඉන්දියාවට යන්න අවස්ථාවක් ලැබුණා. ඔහු නතර වූණේ ජේ.ඩබ්ලිව්. මැරියට් කියන හෝටලයේ. මුම්බායි ඇතුළු ප්‍රදේශවල සංචාරයේ ගියාම ඔහු ගොඩක් කලකිරුණා. ෂාරුක් ඛාන් රඟපාන සිනමාපටවල ඇති සුන්දර ලෝකය, මුකේෂ් අම්බානිගේ තට්ටු ගාණක් උස මහා මන්දිරය අවටවත් නැති බව ඒ පැත්තේ ඇවිදින්න ගිය හවස් වරුවේ ඔහුට හොඳින් වැටහුණා.

ඉන්දියාවේ අඳුරු පැතිකඩ මනාව හෙළි කළ Lion සහ Slumdog Millionaire වැනි විශිෂ්ට සිනමාපට ඔහුට යන්තමට මතක් වුණා. ඔහු දෙවියන් දැඩිව විශ්වාස කළ අයෙක්. ලංකාවට මොහු පැමිණියේ මේ විෂම ලෝකය ගැන තරමක් කෝපය මුසු ශෝකයකිනි. ඒ හැඟීම තවත් වැඩිවූයේ ලංකාවට ඇවිත් දින දෙකකින් පස්සේ වැරහැලි ඇඳගත් දරුවෙකු බොරැල්ලේදී ඔහුගේ මර්සිඩිස් බෙනස් රථයේ වැසුණු වීදුරුවට වේගයෙන් තට්ටු කරමින් කන්න යමක් ඉල්ලූ නිසයි. කොළ එළිය ඔහුට ඒ දරුවාට රුපියලක්වත් දීමට ඉඩ නොතැබුවා. හිතේ කනගාටුව, පැවති කලබලය නිසා එය සාධාරණීකරණය කරගන්නට ඔහු උත්සාහ කළා.

ඔහු නිවසට ආව ගමන් දෙවියන්ට කෝපයෙන් බැණ වැදුණා. ඔහු යළිත් දෙවියන් වෙනුවෙන් කිසිත් නොකරන්නට තීරණය කළා.

"ඔබ වහන්සේ හරිම කුරිරුයි. අඩුගානේ අතක් නැතිව හිඟාකන්න ආව දරුවාටවත් ඔබට යමක් කරන්නට තිබුණා. අසරණයා හැමදාම අසරණයි. ඔබට ඇති බයත් වැඩක් නැහැ." ඔහු දෙවියන්ට බණින්න ගත්තා.

"මම ඒ අසරණයන් වෙනුවෙන් දැනටමත් යමක් කරලා තියෙන්නෙ." තරුණයාව පුදුම කරවමින් දෙවි කෙනෙක් ඔහු ඉදිරියේ පෙනී සිටිමින් අභිමානයෙන් කිව්වා.

"ඒ මොකක්ද?"
"මම ඔබව නිර්මාණය කළා. ඔබට ඔවුන් වෙනුවෙන් යමක් කළ හැකියි." දෙවියෝ කිව්වා.

සැබවින්ම අන්ත අසරණ වුණ මිනිසුන් වෙන්වෙන් යමක් කරන්න නොදැකපු දෙවියන් මහ පොළවට වඩින තුරුම ඉන්න ඕනෑද? මිනිසුන්ට මිනිසුන් වෙනුවෙන් යමක් කළ නොහැකිද? ස්වභාවධර්මය නම් අසීමිත දෙවියන් ඔබ මවා තියෙන්නේ මේ ලෝකය යහපත් ලෙස වෙනස් කරන්න අවශ්‍ය සියලුම ශක්තීන් සහ හැකියාවන් අඩංගු මෘදුකාංගවලින්. ඒවායින් වැඩ ගන්න එක නම් ඔබේ වැඩක්. අන්න ඒ නිසා අනෙක් මිනිසුන්ගේ ජීවිතය වෙනස් කරන්න ඔබට කළ හැකි පුංචිම දේ අදම කරන්න අමතක කරන්න එපා. සැබවින්ම ඔබට ඔවුන් වෙනුවෙන් යමක් කළ හැකියි. මිනිසුන් වෙනුවෙන් යමක් කිරීම ඔබගේ යුතුකමක් නොව වගකීමක්. ඒ වගකීම ඔබ හදවතින්ම ඉටු කරනවා නම් ඔබ මිහිමත සැරිසරන ජීවමාන දෙවියෙක්.

**කල්පනා විජයලත් - 12 - K (කලා අංශය)**

## සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2018

### පළාත් මට්ටම.

**කෙටි කතා**
10 ශ්‍රේණිය
පළාත් තෙවන ස්ථානය - එම්.එච්. මේධානි රවිහංසා

**පද්‍ය නිර්මාණය හා අවබෝධය**
6 ශ්‍රේණිය
පළාත් තෙවන ස්ථානය - ජේ.ටී. ඔනෙලි අයත්මී ජයලත්

10 ශ්‍රේණිය
පළාත් ප්‍රථම ස්ථානය - එන්.ටී. මෙත්වරී යෙනුලි සඳින්කා

11 ශ්‍රේණිය
පළාත් ප්‍රථම ස්ථානය - එල්. උපේක්ෂා ප්‍රහර්ෂි

**අත් අකුරු හා භාෂාවේ ශිල්ප ක්‍රම**
6ශ්‍රේණිය
පළාත් තෙවන ස්ථානය - ඩබ්.එම්. වගීෂා අමන්දි වීරතුංග

**භාෂා භාවිතය හා අවබෝධය**
12 ශ්‍රේණිය
පළාත් තෙවන ස්ථානය - අයි.බී. සත්සරණි දුල්ෂිකා සඳමාලි

**කෙටි නාට්‍ය පිටපත්**
11 ශ්‍රේණිය
පළාත් දෙවන ස්ථානය - එම්.ජ්.පී. භාග්‍යා

**පද්‍යා ගායනා**
11 ශ්‍රේණිය
පළාත් තෙවන ස්ථානය - පී. දෙව්මිණි පුන්සලා සමරසේකර

## පොත් කියවන්නෝ - පෙරටම යන්නෝ තරගය (2018)

### පාසල් මට්ටම

**6 ශ්‍රේණිය**
ප්‍රථම ස්ථානය - කේ.කේ. ටිරුණි සිතුමිණි දේශප්‍රිය
දෙවන ස්ථානය - ඩබ්.ජ්. දෙව්මි අමෝදා

**7 ශ්‍රේණිය**
ප්‍රථම ස්ථානය - රශ්මි කවීෂා පෙරේරා
දෙවන ස්ථානය - ඩබ්.ජ්. අමා දෙව්මිණි

## ගෘහවිද්‍යාගාරයෙන් රස පණිවිඩයක්...

# මාළු බනිස්




**අවශ්‍ය ද්‍රව්‍ය :-**

| | | |
|---|---|---|
| පිටි | - | 250 g |
| යීස්ට් | - | තේ හැඳි ¾ |
| සීනි | - | තේ හැඳි 1 |
| මාගරින් මේස හැඳි | - | ½ |
| ලුණු තේ හැඳි | - | ½ |

වතුර (මඳ රස්නය ඇති) අඩු කෝප්ප ½ හෝ ¾



**මාළු බනිස් පිරවුමට අවශ්‍ය ද්‍රව්‍ය :-**

| | | |
|---|---|---|
| ටින් මාළු | - | ටින් ½ |
| ලොකු අර්තාපල් (තම්බන ලද) | - | 1 |
| කුඩාවට කපාගත් ළූණු | - | ගෙඩි 2 |
| තෙල් මේස හැඳි | - | හැඳි 1 |
| ඉඟුරු කුඩා කැබැල්ලක් | | |
| ලුණු | - | තේ හැඳි 1 |
| කහ කුඩු | - | තේ හැඳි ¼ |
| ගම්මිරිස් කුඩු | - | තේ හැඳි 1 |
| දෙහි යුෂ | - | තේ හැඳි 1 |

**මෝලිය සාදන ක්‍රමය :-** මාගරින් හා පිටි හොඳින් මිශ්‍ර කරන්න. එයට අනෙකුත් ද්‍රව්‍ය එකතු කර මෝලිය මෘදු වනතුරු හොඳින් අනන්න. ඉන්පසු මෝලිය පිපෙන්නට මිනිත්තු 15-20 ක් පමණ තබන්න. පසුව මෝලිය කුඩා බෝලවලට කඩා තුනීකර පිරවුම මැදට තබා තුන් හුලස් ලෙස වසා ගන්න. පසුව මාළුපාන් උඩට බිත්තර කහමදය ආලේප කර 180c° විනාඩි 20-30 පමණ බේක් කරගන්න.

**පිරවුම සාදන ක්‍රමය :-** භාජනය ලිපතබා එයට තෙල් දමා රත්කරගෙන ඉඟුරු දමා තෙම්පරාදු කරගන්න. ඉන්පසු අනිකුත් ද්‍රව්‍ය එක්කර රස පදමට ලුණු දමා ගන්න. මිනිත්තු 3-4 ක් පමණ මද ගින්දරෙන් පිසගන්න.

**ඩබ්.ජී. චන්දිමා කුමාරි ගුරු මහත්මිය**
**ගෘහ විද්‍යා අංශය**

ඔබට සාර්ථක වීමට අවශ්‍ය නම් මමත්වය සීමා කරගන්න. (චාල්ස් ඔගස්ටීන්)

# වාර්ෂික ක්‍රීඩා උත්සවය 2019





සමාරම්භය | ක්‍රීඩා කොඩිය රැගෙන ඒම | ක්‍රීඩා කොඩිය භාර දීම.





ධජ ආරෝහණය | උත්තමාචාරය | ක්‍රීඩිකාවන්ගේ සමාරම්භක පෙළපාලිය





ඔලිම්පික් පහන දැල්වීම | තරඟ ඉසව්වක්





ශිෂ්‍යභට සංදර්ශනය | සරඹ සංදර්ශනය | ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාව






තූර්යවාදන කණ්ඩායම් සංදර්ශන | ජය සංකේත ප්‍රදානය



Deepana Printers - Gmpaha - 033 2226913